ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்
NATIONAL FILM CORPORATION OF SRI LANKA

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
Ministry of Public Administration & Management

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

වාර්ෂික වාර්තාව

2015

පටුන

	පිටුව
පිළිගැන්වීම	01
පාලන වාර්තාව	02 - 23
ශේෂ පත්‍රවල ලාභාලාභ ගිණුම් ආශ්‍රිත සටහන්	24 - 63
විගණකාධිපති වාර්තාව	64 - 78

පිළිගැන්වීම

දිනය : 2016.08.24 මගේ අංකය : එන්එෆ්සි/103/05/02/96

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය
ගයන්ත කරුණාතිලක මැතිතුමා
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක.163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ,
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - වාර්ෂික වාර්තාව 2015</u>

1980 අංක 45 දරණ පනතින් සංශෝධිත 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාර 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වු වසර සඳහා පහත සඳහන් ලේඛනයන් ද සමඟ සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2015 වසරේ සංස්ථාව විසින් කරන ලද කාර්යයන් හා අදාල ප්‍රකාශ
2. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වු වසර සඳහා සංස්ථාවේ ලාභාලාභ ගිණුම්, ආශ්‍රිත සටහන් හා එදිනට ශේෂ පත්‍රය
3. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වු වසර සඳහා විගණකාධිපති වාර්තාව

මෙයට - විශ්වාසී වු ,



නීතිඥ දීපාල් චන්ද්‍රරත්න
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

පාලන වාර්තාව

01. හැඳින්වීම

02. අධ්‍යක්ෂ මණ්ඩලය

03. දේශීය චිත්‍රපට නිෂ්පාදනය

04. පිරිස් හා ආයතන පාලනය

05. චිත්‍රපට ප්‍රචාරනය/සිනේ ඇඩ්ස්

06. චිත්‍රපට ප්‍රදර්ශනය

07. අභ්‍යන්තර විගණන කටයුතු

08. සිනමා සංස්කෘතිය හා අධ්‍යාපන කටයුතු

09. දේශීය සැපයුම් - ආනයනය හා අපනයනය

10. චිත්‍රපට ගබඩාව

11. නෛතික කටයුතු

12. මූල්‍ය කටයුතු

13. චිත්‍රාගාරය

14. පරීක්ෂණ කටයුතු

15. සුභසාධනය

16. ක්‍රීඩා සංගමය

17. ආගමික කටයුතු

18. වෛද්‍ය සහනාධාර ක්‍රමය

19. වෘත්තීය සමිති

20. ස්තුතිය

01. හැඳින්වීම

1980 අංක 45 දරණ පනතින් සංශෝධනය කල 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2014 වර්ෂය පිළිබඳ වාර්තාව

2014 වර්ෂය පිළිබඳ ඉදිරිපත් කරන මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 45 වන ක්‍රියාත්මක වර්ෂයට අදාල වේ.

02. අධ්‍යක්ෂ මණ්ඩලය

2015 වර්ෂය තුල ජාතික චිත්‍රපට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විතව ඇත.

1.	නීතිඥ දීපාල් චන්ද්‍රරත්න මහතා	- සභාපති
2.	සම්පත් සුභසිංහ ආරච්චි මහතා	- ක්‍රියාකාරි අධ්‍යක්ෂ
3.	ආචාර්ය එස්.කේ.එම්.ඩී.දර්ශනි ගුණතිලක	- අ.ම.සාමාජික (නිලබලයෙන්)
4.	විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක	- අ.ම.සාමාජික
5.	පී.වී.පී.දයාරත්න මිය	- අ.ම.සාමාජික
6.	නයන හෙට්ටිආරච්චි මහතා	- අ.ම.සාමාජික
7.	අමල් අල්විස් මහතා	- අ.ම.සාමාජික
8.	එන්.ගොඩකන්ද මිය	- භාණ්ඩාගාර නියෝජිත
9.	නීතිඥ ඩබ්.කේ.වික්‍රමආරච්චි	- අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

03. දේශිය චිත්‍රපට නිෂ්පාදනය

3.1. දේශිය චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කිරීම.

2015 වර්ෂය සඳහා ලියාපදිංචි කරන ලද චිත්‍රපට සංඛ්‍යාව 40 කි.

ලියාපදිංචි ගාස්තු ලෙස රු.2,000/- ක මුදලක් සංස්ථාව අයකර ගනු ලැබේ.

3.2 දේශිය චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදෙනු ලබන ණය පහසුකම්

3.2.1 චිත්‍රාගාර සේවා ණය පහසුකම්

අනුමත චිත්‍රාගාර සේවා ණය පහසුකමේ වටිනාකම රු.400,000/- කි. මෙම වසර තුල චිත්‍රාගාර සේවා ණය පහසුකම් කිසිදු චිත්‍රපට නිෂ්පාදකවරයෙකු හෝ ඉල්ලුම් කර නැත.

3.2.2 චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල චිත්‍රපට නිෂ්පාදනය සඳහා නිෂ්පාදන ණය පහසුකමක් ඉල්ලුම් කර නොමැත.

3.2.3 විශේෂ ණය පහසුකම්

මෙම වර්ෂය තුල කිසිදු විශේෂ ණය පහසුකමක් ලබා දී නොමැත.

3.2.4 පිටපත් මුද්‍රණය සඳහා ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල පිටපත් මුද්‍රණය සඳහා ණය පහසුකමක් ලබා දී නැත.

3.2.5 ප්‍රචාරක ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල සංස්ථා (රීත්මා) මණ්ඩලය යටතේ 2015.10.23 මහජන ප්‍රදර්ශනය සඳහා මුදාහරින ලද සුහද කොකා චිත්‍රපටයෙහි ප්‍රචාරක කටයුතු වෙනුවෙන් රු.මි.05 ක මූල්‍ය දායකත්වයක් (පොලී රහිතව) චිත්‍රපට ආදායමින් නිෂ්පාදකගේ කොටසින් පළමු ගෙවීමට යටත්ව ලබාදීමට කටයුතු කර ඇත.

3.2.6 උපශීර්ෂ පාඨ ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල කිසිදු චිත්‍රපටයක් සඳහා උපශීර්ෂ පාඨ ණය පහසුකමක් ලබා දී නොමැත.

3.3 සිනමා ශිල්පීන් හා **කාර්මික ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ කාර්මික හැඳුනුම්පත් නිකුත් කිරීම**

වසර කිහිපයක් මෙම කාර්ය නිසියාකාරව සිදු නොකල අතර, මෙම වර්ෂයේ දි නිෂ්පාදන/අලෙවි/පර්යේෂණ අංශය මගින් නව වැඩසටහනක් ලෙස කාර්මික ශිල්පීන් ලියාපදිංචි කිරීම හා නව හැඳුනුම්පත් 107 ක් නිකුත් කිරීම සිදුකර ඇත.

3.4 **දේශිය චිත්‍රපට නිෂ්පාදනය සඳහා විදේශිය නළු, නිළි, කාර්මික ශිල්පීන් යොදා ගැනීම වෙනුවෙන් අනුමත ගාස්තු අයකිරීම**

මෙම වසර තුල දේශිය චිත්‍රපට වෙනුවෙන් යොදා ගන්නා ලද විදේශිය නළු, නිළි, කාර්මික ශිල්පීන් වෙනුවෙන් අයකිරීමක් සිදුකර නොමැත.

3.5 **දේශිය වෘතාන්ත /වෙළඳ වාර්තා වැඩසටහන් රූගත කිරීම සඳහා කැමරා උපකරණ ලබාගැනීම අනුමත කිරීම වෙනුවෙන් කරනු ලබන අයකිරීම**

වෘතාන්ත චිත්‍රපට 01 ක් හා විදේශිය වෙළඳ වැඩසටහන් 01 ක් වෙනුවෙන් අදාල කටයුතු කර ඇත.

3.6 **සුවිශේෂි කලාකරුවන් ඇගැයීම**

- චිත්‍රපට අධ්‍යක්ෂ නිහාල් ප්‍රනාන්දු මහතා වෙත වෛද්‍යධාර වශයෙන් රු.50,000/- මූල්‍ය පරිත්‍යාගයක් ලබා දීම.
- රංගන ශිල්පි සුනිල් හෙට්ටිආරච්චි මහතා වෙත වෛද්‍යාධාර වශයෙන් රු.50,000/- ක මූල්‍ය පරිත්‍යාගයක් ලබාදීම.

3.7 **චිත්‍රපට ආනයනය**

වර්ෂය තුල ලියාපදිංචි ආනයනයකරුවන් සංඛ්‍යාව 25 කි.

ඒ අනුව, 2015 වර්ෂය තුල චිත්‍රපට ආනයනය කිරීම වෙනුවෙන් ප්‍රදර්ශන මණ්ඩල 05 හරහා අනුමැතිය ලබාදුන් චිත්‍රපට සංඛ්‍යාව පහතින් දැක් වේ.

- දෙමළ චිත්‍රපට - 58
- හින්දි චිත්‍රපට - 20
- ඉංග්‍රිසි චිත්‍රපට - 49

3.8 චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ සංස්ථා භාරය

3.8.1 විශ්‍රාම වැටුප් ගෙවීම: (විශ්‍රාම වැටුප් ගෙවීම එක් අයකුට රු.2,000/- බැගින්)

- ජනවාරි - පෙබරවාරි (විශ්‍රාමිකයන් 62 දෙනෙකු වෙනුවෙන්) රු.248,000.00
- මාර්තු - ජූනි (විශ්‍රාමිකයන් 61 දෙනෙකු වෙනුවෙන්) රු.488,000.00
- ජූලි (විශ්‍රාමිකයන් 60 දෙනෙකු වෙනුවෙන්) රු.120,000.00
- අගෝස්තු - සැප්තැම්බර් (විශ්‍රාමිකයන් 59 දෙනෙකු වෙනුවෙන්) රු.236,000.00
- ඔක්තෝම්බර්-දෙසැම්බර් (විශ්‍රාමිකයන් 58 දෙනෙකු වෙනුවෙන්) රු.348.000.00

3.8.2 205 වසර තුළ මියගිය විශ්‍රාමලාභින් :

- යූ.එස්.රස් හමීඩ් මහතා (2015.05.04)
- මොහොමඩ් ස්මයිල් ලාල් මහතා (2015.06.06)
- මර්ෂලින් එස්.පෙරේරා මහතා (2015.10.06)
- විශ්‍රාම වැටුප්ලාභී නොයෙල් විතානගේ මහතා මියගොස් ඇත. (රංගන ශිල්පී)

3.9 <u>ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල</u>

3.9.1 සුවිශේෂ කලාකරුවන් ඇගැයීම.

- ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ 96 උපන්දින සැමරුම් උත්සවය වෙනුවෙන් රු.100,000/- ක හා මූල්‍ය ආධාරයක් ලබාදීම.
- ප්‍රවීණ රංගධර බර්ටි ගුණතිලක මහතාගේ 91 වන උපන්දිනය වෙනුවෙන් රු.100,000/- ක මූල්‍ය පරිත්‍යාගයක් ලබා දීම.

3.9.2 විදේශීය / වෘතාන්ත / වෙළඳ වැඩ සටහන් රූගත කිරීම් සඳහා අවසර ලබා ගැනීම.

වෘතාන්ත චිත්‍රපට 1, වාර්තා චිත්‍රපට 34 ක් සහ වෙළඳ වැඩසටහන් 15 ක් වෙනුවෙන් අයවිය යුතු ගාස්තු අවකර ගෙන ඇත.

04. පිරිස් හා ආයතන පාලනය

4.1 කාර්ය මණ්ඩලය

2015.01.01 දිනට සේවක සංඛ්‍යාව	-	140
2015 වර්ෂය තුල බඳවාගත් සංඛ්‍යාව	-	-

2015 වර්ෂය තුල ඉවත් වු සංඛ්‍යාව

විශ්‍රාම ලැබූ සංඛ්‍යාව	-	05	
සේවයෙන් ඉල්ලා අස් වු සංඛ්‍යාව	-	02	
			07
			133

ස්ථිර කාර්ය මණ්ඩලය	-	133
සභාපති	-	01
ක්‍රියාකාරි අධ්‍යක්ෂ	-	01
දෛනික දීමනා	-	01
2015.12.31 දිනට මුළු සේවකයන්	-	143

4.2 ආයතන පාලනය හා සේවක අවශ්‍යතා ඉටු කිරීම.

ආයතනයේ සේවක පාලනයට අදාලව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයමින් සේවා කටයුතු ඉටු කර ඇත.

05. චිත්‍රපට ප්‍රචාරණය / සිනේ ඇඩ්

5.1 වසර තුල ඉටුකල කාර්යයන්

5.1.1 ප්‍රදර්ශනයට මුදා හරින ලද දේශීය චිත්‍රපට වල පුවත්පත් ප්‍රචාරක කටයුතු

i	සතියකට මට රට භාරදෙන්න	ii	අනාථ දූපත
iii	බෝනික්කා	iv	ලැන්ටින් සිංඤ්ඤෝ
v	සංජානා	vi	සුහඳ කොකා
vii	නෝනේ මගේ සුදු නෝනේ		

5.1.2 ආනයනය කරන විදේශීය චිත්‍රපට වල පුවත්පත් ප්‍රචාරක කටයුතු

i	NH 10 – Hindi	ii	Amari Adur Kahan - Hindi
iii	Alone – Hindi	iv	ABCD – Hindi
v	36 Yayathalai – Tamil		

5.1.3 සිනමාශාලාවල ප්‍රදර්ශනය වන චිත්‍රපට පිළිබඳ ප්‍රචාරක කටයුතු

- ලිබර්ටි ලයිට් - කොල්ලුපිටිය
- ඇමිටි ලයිට් - මහරගම
- සිටි සිනමා - ගල්කිස්ස

5.1.4 මාධ්‍ය ප්‍රචාරක කටයුතු

- දේශීය සිනමාවේ 68 වන සැමරුම හා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා 43 වන සැමරුම .
- 2015.03.20 දින සිට 2015.03.22 දින දක්වා පැවති තායි චිත්‍රපට උළෙල
- 2015.04.04 දින පැවැති ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් 96 වන උපන්දින සැමරුම.
- 2015 අප්‍රේල් 4 සහ 5 දින පැවැති "හංස විලක්" චිත්‍රපට උළෙලේ සහ අප්‍රේල් 06 දින පැවැති සිනමා කතිකාව වැඩසටහන
- 2015.07.03 දින පැවැති "ලාංකේය අධ්‍යාත්මය නැංවීමෙහි ලා සිනමාව" යන මැයෙන් පැවති සිනමා කතිකාව
- 2015 ඔක්තෝබර් 01 වන දිනට යෙදී තිබූ ලෝක ළමා දිනය වෙනුවෙන් "Life of Pie" ප්‍රදර්ශනය කිරීම.
- 2015.10.23 සිට 2015.10.25 දින දක්වා පැවැති ජපාන චිත්‍රපට උළෙල
- 2015.11.04 සිට 2015.11.07 දක්වා පැවැති කොරියානු චිත්‍රපට උළෙල වේ

06. <u>චිත්‍රපට ප්‍රදර්ශනය</u>

6.1 සංස්ථා ප්‍රදර්ශන මණ්ඩලය (රිත්මා එන්ටර්ප්‍රයිසස්)

- 2015 වර්ෂය තුළදී රිත්මා මණ්ඩලය යටතේ සිනමාශාලා 58 ක් ක්‍රියාත්මක විය.
- අලුතින් ඉදිකරන ලද ධම්මික - වැල්ලවාය, රැජින මාලිනි - තඹුත්තේගම යන සිනමාශාලා 2015 වර්ෂයේ චිත්‍රපට ප්‍රදර්ශන කටයුතු ආරම්භ කර ඇත.

6.2 චිත්‍රපට මුදාහැරීම

- සිනමාශාලා 58 ක් සඳහා රිත්මා මණ්ඩලය විසින් චිත්‍රපට මුදාහැර ඇත.
- 2015 වර්ෂය තුළ රිත්මා මණ්ඩලය හා අනෙකුත් මණ්ඩල සමඟ ඒකාබද්ධ වී චිත්‍රපට මුදාහැරීමට කටයුතු කර ඇත.
- රිත්මා මණ්ඩලය මගින් සිංහල චිත්‍රපට 06 ක් මුදාහැරීමට කටයුතු කර ඇත.

- මෙම වර්ෂයේ ජනවාරි සිට සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද දෙමළ චිත්‍රපට 22 ක් හා හින්දි චිත්‍රපට 10 ක් රිත්මා මණ්ඩලයේ හා අනෙකුත් මණ්ඩල සිනමා ශාලාවන් හා ඒකාබද්ධ වී මුදාහැරීමට කටයුතු කර ඇත.
  (සංස්ථා මණ්ඩලය වෙත ලබා දී ඇති කොටසින් (කෝටා) හා අනෙකුත් මණ්ඩල කොටස් වලින් (කෝටා) චිත්‍රපට ලබාගෙන රිත්මා මණ්ඩලය විසින් මුදාහැරීමට කටයුතු කර ඇත.)

6.3 චිත්‍රපට කුලිය

අප මණ්ඩලය විසින් අනෙකුත් මණ්ඩලවලට සපයන ලද චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි චිත්‍රපට කුළී මුදල් ලැබී ඇත. (2015 සැප්තැම්බර් මස දක්වා)

- ලංකා ෆිල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 6,386,339.37
- මූවි ප්‍රඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 1,691,228.75
- සිනමා එන්ටර්ටේට්මන් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු.12,614,922.10
- ඊ.ඒ.පී.ෆිල්ම්ස් ඇන්ඩ් තියටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 1,030,732.14

අප මණ්ඩලයේ අනෙකුත් මණ්ඩල වලින් ලබාගත් චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි මුදල් ගෙවා ඇත. (2015 සැප්තැම්බර් මස දක්වා)

- ලංකා ෆිල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 1,454,463.99
- මූවි ප්‍රඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 3,705,944.21
- සිනමා එන්ටර්ටේට්මන් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු.12,748,925.43
- ඊ.ඒ.පී.ෆිල්ම්ස් ඇන්ඩ් තියටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු.26,591,327.90
- රිපෝ තැන්පතු

  2015 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා රු.24,169,989.75 ක තැන්පතු ඇත. 2015 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා කොමිස් මුදල පහත සඳහන් පරිදි ගණනය කල හැක.

  රු.21,424,689,45

  - 2015 වර්ෂය තුල විවිධ සමිති සමාගම් හා විශ්ව විද්‍යාල හා පාසැල් සිසුන් සඳහා සහන මිලක් යටතේ ආධාර ලබා ගැනීම සඳහා චිත්‍රපට ලබාදීම.
  - පොලිස් අභ්‍යාස විද්‍යාලය සඳහා හා හමුදා කඳවුරු සඳහා සහන මිලකට චිත්‍රපට ලබා දීම.

07. අභ්‍යන්තර විගණන කටයුතු

අභ්‍යන්තර විගණන කටයුතු 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධාන වලට අනුකූලව හා විගණකාධිපතිගේ අවධානයට යටත්ව සිදුකර ඇත.

වර්ෂය තුල ක්‍රියාත්මක විගණන හා කළමනාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

එන්.ගොඩකන්ද මිය	- මහා භාණ්ඩාගාරයේ නියෝජිත - කමිටු සභාපති
ඩබ්.ශ්‍රියානි හංවැල්ල මිය	- අභ්‍යන්තර විගණක - කමිටු ලේකම්
වෛද්‍ය අනිල් සමරනායක	- අධ්‍යක්ෂ, වෛද්‍ය පර්යේෂණ ආයතනය කමිටු සාමාජික
ආචාර්ය එස්.කේ.එම්.දර්ශනි ගුණතිලක	- අධ්‍යක්ෂ, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව කමිටු සාමාජික
අමල් අල්විස් මහතා	- කමිටු සාමාජික
කේ.සී.පී.සේනාරත්න මිය	- විගණකාධිපති දෙපාර්තමේන්තුව කමිටු නිරීක්ෂණය

වසර තුළ විගණන හා කළමනාකරණ රැස්වීම් වාර 03 ක් පවත්වා ඇත.

08. සිනමා සංස්කෘතික හා අධ්‍යාපන කටයුතු

8.1 අධ්‍යාපන වැඩසටහන්

අරමුණු	ප්‍රධාන ක්‍රියාකාරකම්	නිමවුම් දර්ශකය	භෞතික ප්‍රගතිය		%	මූල්‍ය ප්‍රගතිය (රු.මි)		%	මුදල් සපයා ගන්නා ආකාරය	වගකීම
			වාර්ෂික ඉලක්කය	2015.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය		වාර්ෂික ප්‍රතිපාදනය	2015.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය			
අධ්‍යාපන, ප්‍රවර්ධන හා සංස්කෘතික										
1. උසස් ශ්‍රී ලාංකේය සිනමා සංස්කෘතියක් බිහි කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ශාස්ත්‍රීය හා සංකල්පීය පදනමක් සකස් කිරීම.	සිනමාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම. (2015)	ලියාපදිංචි වන සිසුන් සංඛ්‍යාව	50	31	62	2.5	0.5	20	පාඨමාලා ගාස්තු හා ජාතික චිත්‍රපට සංස්ථාව	සහකාර සාමාන්‍යාධිකාරී - අධ්‍යාපන, ප්‍රවර්ධන හා සංස්කෘතික
2. සිනමා සංස්කෘතිය පෝෂණය කිරීම උදෙසා සිනමා සාක්ෂරතාව වර්ධනය කිරීම.	සිනමා සම්බන්ධ ප්‍රකාශන එළි දැක්වීම 1. මුද්‍රිත සඟරා 2. මුද්‍රිත ප්‍රකාශන	මුද්‍රිත සඟරා සංඛ්‍යාව මුද්‍රිත ප්‍රකාශන සංඛ්‍යාව	3000 2000	3000 -	100 -	0.4 0.3	0.4 -	100 -	අනුග්‍රාහක ආයතන හා ජාතික චිත්‍රපට සංස්ථාව	
සිනමාව සම්බන්ධ ලේඛකයින්ගෙන් සම්පත් දායකත්වය ලබා ගැනීමට මූලික කටයුතු සිදු කළ ද, අපේක්ෂිත මට්ටමේ ග්‍රන්ථ සම්පාදනය කර ගත නොහැකි විය.										
3. සිනමා ප්‍රේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමෙන් සිනමා කළාව සහ කර්මාන්තය පෝෂණය කිරීම	"ජීවිතයට සිනමාව" රසවින්දන වැඩසටහන්/ වැඩමුළු	වැඩ සටහන් සංඛ්‍යාව	8	7	87.5	0.2	0.06	30		

4. අංකුර සිනමාකරුවන් සිනමාව කෙරෙි සක්‍රීයව දායක කර ගැනීම	කෙටි චිත්‍රපට නිර්මාණ තරඟය / උළෙල	චිත්‍රපට උළෙල	1	-	-	0.45	-	-	ජාතික චිත්‍රපට සංස්ථාව හා ආයතන අනුග්‍රහක සංස්ථාව	සහකාර සාමාන්‍යාධිකාරී - අධ්‍යයන , ප්‍රවර්ධන හා සංස්කෘතික
රටේ පැවැති දේශපාලනික තත්ත්වය සමඟ ජාතික මට්ටමේ උළෙලක් පැවැත්වීමට අපහසු තත්ත්වයක් පැවැතීම										
5. සිනමාවේ නව ප්‍රවණතා හඳුනා ගැනීම, විචාරය සහ ප්‍රතිචාර සෙවීම	සිනමා කතිකා වැඩසටහන් පැවැත්වීම	පවත්වනු ලබන වැඩසටහන් සංඛ්‍යාව	4	2	50	0.12	0.08	66		
6. චිත්‍රපට රසවින්දනය කෙරෙහි ප්‍රේක්ෂක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.	අධ්‍යාපනික චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම.	ප්‍රදර්ශනය වන චිත්‍රපට සංඛ්‍යාව	8	10	125	0.1	0.069	69	ජාතික චිත්‍රපට සංස්ථාව හා ආයතන අනුග්‍රහක සංස්ථාව	
7. උසස් ශ්‍රී ලාංකේය සිනමා සංස්කෘතියක් බිහි කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ශාස්ත්‍රීය හා සංකල්පීය පදනමක් සකස් කිරීමට අවශ්‍ය පුස්තකාල පහසුකම් සැපයීම	සිනමා පුස්තකාලය යාවත්කාලීන කිරීම. (ග්‍රන්ථ හා චිත්‍රපට) 1. ග්‍රන්ථ හා සඟරා මිලදී ගැනීම. 2. Blu Ray සහ DVD චිත්‍රපට පිටපත් මිලදී ගැනීම.	ග්‍රන්ථ හා සඟරා සංඛ්‍යාව පිටපත් සංඛ්‍යාව	20 50	51 66	255 132	0.02 0.02	0.015 0.0198	75 99		

9. දේශීය සැපයුම් ආනයනය හා අපනයනය

- සිනමාශාලා හිමියන් සහ සංස්ථා කාර්යය මණ්ඩල සේවා අවශ්‍යතා සඳහා අවශ්‍ය කාර්යාලීය ලිපිද්‍රව්‍ය නියමිත ක්‍රමවේදයන්ට අනුව මිලදී ගෙන සැපයීම.
- සිනමාශාලා සඳහා ප්‍රවේශපත්‍ර මුද්‍රණය කර සැපයීම.
- සිනමාශාලා සඳහා සිනමා ආර්ක් කාබන් ආනයනය.
- සංස්ථාවේ ප්‍රයෝජනය සඳහා ස්ථාවර වත්කම් මිලදී ගැනීම.
- ඡායා පිටපත්, පරිගණක ඇතුළු උපාංග, වායුසමීකරණ, ෆැක්ස් යන්ත්‍ර සහ පරිගණක වැඩ සටහන් සඳහා අවශ්‍ය අවශ්‍යතාවයන්හීදී අදාළ නියෝජිත ආයතන සමග සේවා ගිවිසුම් වලට එළඹීම.
- ඡායා පිටපත්, පරිගණක ඇතුළු උපාංග, වායුසමීකරණ , ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියාව සහ සේවා කිරීම.
- 2015/2016 වර්ෂය සඳහා සංස්ථා කාර්යාල පරිශ්‍ර සඳහා ආරක්ෂක සේවා සහ සනීපාරක්ෂක සේවා සැපයීම.

10. චිත්‍රපට ගබඩාව

10.1 කාර්ය භාරය

- චිත්‍රපට සංස්ථාවේ අවසරය මත ආනයනය කරනු ලබන විදේශීය චිත්‍රපට හා දේශීයව නිෂ්පාදනය කරනු ලබන චිත්‍රපට භාරගෙන ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම.

- එම චිත්‍රපට භාරගෙන තත්ත්ව පරීක්ෂා කර රැගුම් පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම, තත්ත්ව වාර්තාව ලබා ගැනීම තුලින් සංස්ථාවට ආදායමක් ලැබීමට සැලැස්වී. රැගුම් පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි නැවත තත්ත්ව වාර්තා ලබාගෙන ආනයනකරු / නිෂ්පාදක බෙදාහැරීම් මණ්ඩලයට භාරදීම හෝ සිනමාශාලා වෙත ලබා දීම.

- සංස්ථා මණ්ඩලය මගින් අනුපෙළ ගන්වනු ලබන චිත්‍රපට නියමිත සිනමාශාලා වෙත දුම්රියෙන් සහ අතින් චිත්‍රපට යැවීම හා නිසි පරිදි ගෙන්වා ගැනීම.

- එම චිත්‍රපට වලට අදාල පූර්ව ප්‍රචාරකපට ද්‍රව්‍ය සිනමාශාලා වෙත කල්වේලා ඇතිව යැවීම.

- චිත්‍රපට ගබඩාව වෙත ලැබෙන සියලුම චිත්‍රපට නැවත පරීක්ෂා කොට රාක්කගත කිරීම.

- රාක්ක ගතකර ඇති චිත්‍රපට වරින් වර පරික්ෂා කිරීම.

- තත්ත්ව පරික්ෂා කිරීමෙන් උපයා ඇති මුදල ලක්ෂ 12 ක් පමණ වේ.

- චිත්‍රපට ගබඩාවේ ඇති පැරණි චිත්‍රපට ප්‍රතිසංස්කරණය කර නැවත ප්‍රදර්ශනයට සුදුසු ආකාරයෙන් සකස් කිරීම හා සංස්ථාව වෙත ආදායමක් උපයා දීම.

- පැරණි චිත්‍රපට වලින් ධාවනයට සුදුසු පිටපත් 03 ක් පමණක් ගබඩාවේ රඳවා ඉතිරි වන සියලු චිත්‍රපට අයිතිකරුවන් වෙත භාරදීම මඟින් චිත්‍රපට ගබඩාවේ නඩත්තු කටයුතු ක්‍රමවත්ව සිදුකිරීම.

- චිත්‍රපට ගබඩාවේ ගොඩගසා ඇති ගිවිසුම් කාලය අවසන් වූ චිත්‍රපට හා අබලන් චිත්‍රපට අයිතිකරුවන් වෙත දන්වා යැවීමෙන් පසු පිලිස්සීමට කටයුතු කොට එහිදි ඉතිරිවන අළු අලෙවි කර සංස්ථාව වෙත ආදායමක් ලබා ගැනීම.

- සිංහල චිත්‍රපට 21 ක් ලියාපදිංචි කර ඇත.

- අධි ලේඛනාගාරයේ තැම්පත්කර ඇති සිංහල චිත්‍රපට තත්ත්ව පරික්ෂා කිරීමට කටයුතු කිරීම.

11. නෛතික කටයුතු

11.1 කාර්ය භාරය

- සංස්ථාව පාර්ශවයක් වන නඩු සම්බන්ධයෙන් සංස්ථාව වෙනුවෙන් පෙරකලාසි ගොනු කිරීම හා අදාල අධිකරණයේ සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.

- කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරියේ කම්කරු ආරවුල් සඳහා සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.

- ජාතික චිත්‍රපට සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන චිත්‍රපට, චිත්‍රපට බෙදාහැරීම සම්බන්ධයෙන් සහ චිත්‍රපට නිෂ්පාදනය / චිත්‍රාගාර සේවා / පිටපත් මුද්‍රණය / උපශීර්ෂ පාඨ යෙදීම / ප්‍රචාරක කටයුතු සඳහා ණය මුදල් ලබාදීම සහ සේවා සැපයීමේ සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.

- ජාතික චිත්‍රපට සංස්ථාවට උපකාරක සේවා ලබාගැනීම සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම හා අත්සන් තැබීම.

- එදිනෙදා අවශ්‍යතාවය පරිදි සංස්ථාවේ ඕනෑම අංශයකින් යොමුකරන නීතිමය ගැටලු සඳහා උපදෙස් ලබාදීම.

11.2 අධිකරණ කටයුතු

11.2.1 2015 වර්ෂය තුල ක්‍රියාත්මක වෙමින් පැවති හා පවතින නඩු පිළිබඳ විස්තර

1. අභියාචනාධිකරණ නඩු අංක : 590/2007
2. අභියාචනාධිකරණ නඩු අංක : 870/99
3. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක : 97659/5/11
4. දිසා අධිකරණ නඩු අංක : DMR 1126/2012 – සිනේ සිටි සිනමාශාලා 4 න් සංස්ථාවට ගෙවිය යුතු සංස්ථා භාරය නොගෙවීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් නඩු පවරන ලදි.
5. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP/00026/2013, DSP/00027/2013, DSP/00028/2013, DSP/00029/2013, DSP/00030/2013
6. අභියාචනාධිකරණ පෙත්සම් අංක : CA(Writ) Application No : 144/2013
7. කම්කරු විනිශ්චය සභා නඩු අංක : 13/41/2013
8. කම්කරු විනිශ්චය සභා නඩු අංක : 2/435/2014
9. කම්කරු විනිශ්චය සභා නඩු අංක : 2/47/2014
10. DMR 2603/2013 වලාපටල චිත්‍රපටය
11. CHC 370/2014 සුහා චිත්‍රපටය
12. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 140/2015
13. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DMR 00030/2015
14. හලාවත දිසා අධිකරණ නඩු අංක : SPL 4160/2015
15. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 00052/2015
16. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක : MC 30392/5
17. කම්කරු දෙපාර්තමේන්තුවේ පැවැති පරීක්ෂණ
    - I හිටපු සංස්ථා සේවක – ඩබ්.එස්.ෆොන්සේකා මහතා ඇතුළු පිරිස
    - II කම්කරු කාර්යාලය පැමිණිලි අංකය : IR/15/19/2012 - සංස්ථා සේවක සමිත දිසානායක මහතා

12. මූල්‍ය කටයුතු

12.1

	2014	2015
ප්‍රදර්ශනයෙන් ලත් ආදායම	28,337,822	47,198,999
සිනමා කාබන්	2,496,080	2,307,960
ලිපි ද්‍රව්‍ය	1,185,398	1,342,237
අමතර කොටස්	5,507,545	21,168
සිනේ ඇඩ්ස්	364,188	390,026
චිත්‍රාගාරය	1,481,969	2,288,688
අතිරික්තය	36,807,353	20,813,275

2015 වර්ෂයේ විකුණුම් ආදායම රු.මිලියන 53.6 කි. එය 2014 වර්ෂයේ රු.මිලියන 39.6 ක් වු අතර, 2014 ට වඩා 2015 දී විකුණුම් ආදායම රු.මිලියන 14 කින් වැඩි වී ඇත. මෙයට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැක්කේ, බොදාහැරීමේ කොමිස් 78.3% , විදේශ බෙදාහැරීම් කොමිස් 96.4% හා සංස්ථා භාරය 39.5% ක් වැඩි වීම වේ. ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබෙන නිර්මාණ බිහිවීම හා විදේශ චිත්‍රපට ආනයනය මෙම වැඩි වීම් වලට බලපා ඇත.

12.2 මෙම වර්ෂයේ පසුගිය වර්ෂයට වඩා සමස්ථ වියදම රු මිලියන 32.4 ක් වැඩි වී ඇත.

සේවක පාරිශ්‍රමික රු මිලියන 15.22 කින්ද, සේවක පාරිතෝෂික වෙන් කිරීම රු මිලියන 16.4 කින් ද වැඩි වීම ප්‍රධාන වශයෙන් බල පා ඇත.

12.3 වර්ෂය තුල භාණ්ඩාගාරයෙන් පුනරාවර්ථන වියදම සඳහා රු මිලියන 80 ක් ලැබී ඇත. වර්ෂයේ ශුද්ධ අලාභය රු මිලියන 59.1 කි. පසුගිය වර්ෂයේ ශුද්ධ අලාභය රු මිලියන 38.1 කි.

භාණ්ඩාගාරයෙන් ලැබුණු පුනරාවර්ථන ආදායම ගැලපු විට 2015 වර්ෂයේ අතිරික්තය රු මිලියන 20 කි.

12.4 භාණ්ඩාගාරයෙන් අනුමත ප්‍රාග්ධන මුදල් වලින් මෙම වර්ෂයේ රු. මිලියන 30 ක් ලැබී ඇත.

12.5 නිෂ්පාදන ණය සහ සිනමාහල් ණය

චිත්‍රපට ප්‍රදර්ශනයේ දි ප්‍රචාරක කටයුතු සඳහා ණය පහසුකම් ලබා දී ඇත.

12.6 ආයෝජන

වර්ෂය අවසානයේ ස්ථාවර තැන්පතු වල රු මිලියන 16 ක් ද, භාණ්ඩාගාර බිල්පත්වල රු මිලියන 85 ක් සහ රිපෝ තැන්පතු වල රු මිලියන 104 ක් ද කෙටි කාලීනව අයෝජනය කර තිබේ. මෙම මුදල් වලින් රු මිලියන 49 ක් සංස්ථාවේ සේවක මහත්ම මහත්මීන්ගේ පාරිතෝෂික මුදල් සඳහා වන අතර සිනමාහල් වලින් ලබාගන්නා ඇප මුදල් රු මිලියන 2.4 ක් ද වේ.

12.7 සේවක පාරිශ්‍රමික ගෙවනු ලබන්නේ භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් වලිනි. ඒ හේතුව මත වර්ෂයේ ආදායම් බදු වෙන් කිරීමක් කර නොමැත.

13 චිත්‍රාගාරය

පශ්චාත් නිශ්පාදන අදියරේ පවතින චිත්‍රපට සඳහා කාර්මික සේවාවන් සහ පහසුකම් සැපයීම චිත්‍රාගාරයේ ප්‍රධාන කාර්යය භාරය වේ.

ඒ අනුව, සුපුරුදු පරිදි 2015 වසරේදීත් චිත්‍රාගාරයේ පහත සඳහන් අංශ වලින් දේශීය චිත්‍රපට නිෂ්පාදකවරුන්ට අවශ්‍ය කාර්මික සේවාවන් සහ පහසුකම් සපයා ඇත.

1. ශබ්ද අංශය (Digital)
2. අරේඛීය සංස්කරණ අංශය (Digital)
3. චිත්‍රපට හා රූපවාහිනි රූපගත කිරීමේ මැදිරිය

13.1 ඉටු වී ඇති කාර්යයන්

1 සරසවි චිත්‍රාගාරය විසින් චිත්‍රපට කර්මාන්තයට ලබාදෙන කාර්මික පහසුකම් අනුව දේශිය චිත්‍රපට 24 ක් පමණ කාර්මික සේවාවන් මෙම කාලය තුල ලබාදී ඇත.

2 චිත්‍රපට සහ රූපවාහිනි වැඩසටහන් රූගත කිරීම සඳහා වන පහසුකම් චිත්‍රාගාරයේ අභ්‍යන්තර මැදිරිය සහ චිත්‍රාගාර ආලින්දයේ මෙන්ම උද්‍යානය තුලදි ලබා දී ඇති අතර, අදාල කාලය තුළ චිත්‍රපට 05 ක් ද රූපවාහිනි වැඩසටහන් 06 ක් සඳහා ද රූගත කිරීමේ පහසුකම් ලබා දී ඇත.

3 චිත්‍රාගාරයේ ශබ්ද අංශයේ එක් මැදිරියක් ජාත්‍යයන්තර ප්‍රමිතීන්ට අනුව බහුමාන ශබ්ද පටිගත කිරීම සඳහා නවීකරණය කිරීම.

මෙම ව්‍යාපෘතිය සඳහා සියළු කටයුතු අවසන් කර මිල ගණන් කැඳවා ඇති අතර, මිල ගණන් සසඳා ටෙන්ඩර් ප්‍රදානය කිරීම සිදුකළ යුතුය.

4 චිත්‍රාගාරයේ ඩිජිටල් සංස්කරණ අංශය සඳහා නවීන තාක්ෂණානුකූල නව සංස්කරණ පද්ධතියක් මිලදී ගෙන උසස් තත්ත්වයේ වර්ණ නිවැරදි කිරීමේ (Color Correction) සහ ත්‍රිමාණ රූප නිර්මාණය කිරීමේ (Computer generated image) තාක්ෂණය වැඩි දියුණු කිරීම.

චිත්‍රපටයක් මුද්‍රණය කිරීමට පෙර වර්ණ නිවැරදි (Color Correction) කිරීම සහ පරිගණක ආශ්‍රිත රූප නිර්මාණය කිරීම (Computer generated image) මූලික කරගනිමින් දේශීය සිනමා කර්මාන්තයට අවශ්‍ය ලෙස මෙම අංශය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවා ඇති අතර, මිල ගණන් සසඳා ටෙන්ඩර් ප්‍රදානය කිරීම සිදුකළ යුතුය.

5 ශබ්දාගාරයේ B.A.W ජයමාන්න මැදිරිය බහුකාර්ය අධ්‍යයන කාමරයක් ලෙස නවීකරණය කර රූගත කිරීම, සිනමා පාඨමාලා සහ සිනමා සම්බන්ධ විශේෂ අවස්ථා සඳහා කුලියට ලබාදීමට අවශ්‍ය මූලික කටයුතු අවසන් කර ඇත.

13.2 චිත්‍රාගාරයේ පශ්චාත් කාර්මික සේවාවන් ලබාගත් චිත්‍රපට - 2015

ශබ්ද අංශය

1. සුදු සමනලී
2. වස්දඬු රාවය
3. The Rainbow
4. කෙටි චිත්‍රපටය
5. හෝ ගාන පොකුණ
6. තරු මිතුරෝ
7. සුරඟනා
8. ආලෝකෝ උදපාදි
9. බොට හොඳ නම් මට මොකෝ
10. පත්තිනි
11. ආදර කතාවක්
12. The Undecided
13. Dr. නවරියන්
14. වීරවර්ණ
15. ටයිගර්
16. මැද පොඩ්ඩක් පැත්තක් නෑ
17. ආදර පූජාසනේ
18. වෙස්වලාගත් තරුණිය
19. Jobless Douglas
20. TV Commercial
21. උලත් එකයි පිලත් එකයි
22. බඹර වසන්තය
23. Education Programme – Sri Lanka Foundation

රේඛීය නොවන සංස්කරණ අංශය

1. සුරඟනා
2. කුමරි කන්‍යාවී
3. ආත්ම වර්ෂා
4. නටන්නැතින දින්නා
5. ඔළුව ජපන් කඳ ජර්මන්
6. Documentry (Dharmaloka College)
7. Documentry (Mr.Sujitha Kurruppu)

චිත්‍රාගාරයේ රූගත කළ චිත්‍රපට / රූපවාහිනී වැඩසටහන් - 2015

1. Tokyo Cement All Island School Quiz
2. Derana – Dell Studio
3. Sri Lanka Rupavahini Corporation – Muthuhara Programme
4. Sri Lanka Rupavahini Corporation – Rin Bright Star
5. Asia Broadcasting (Pvt) Ltd. – Hiru Unplugged
6. ස්වර්ණවාහිනී ආයතනය - පැනඩෝල් සහනාභිමානී
7. කළුහිම - චිත්‍රපටය
8. වීරවර්ණ - චිත්‍රපටය
9. Jobless Douglas - චිත්‍රපටය
10. අතුරු මිතුරු - චිත්‍රපටය
11. නටන්නැතිව දින්නා - චිත්‍රපටය

13.3 වර්ෂය තුළ චිත්‍රාගාරයේ ලැබීම්

ශබ්ද අංශය	2,239,988
සංස්කරණ අංශය (NLE)	143,475
රූගත කිරීම්	2,324,667
සමස්ථ ලැබීම්	4,708,130

14. <u>පරීක්ෂණ කටයුතු</u>

14.1 වර්ෂය තුල පරීක්ෂණ අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

- සිනමාශාලා ඉදිරිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස්කිරීම
- නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම

- සිනමාශාලා පරික්ෂා කිරීම
- විදේශ රූගත කිරීම් අධීක්ෂණය

14.2 වර්ෂය තුල පරීක්ෂණ අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

- හලාවත යෝජිත සිනමාශාලාව
- අම්බලංගොඩ යෝජිත සිනමාශාලාව
- Saxon කොල්ලුපිටිය යෝජිත සිනමාශාලාව
- රාජගිරිය යෝජිත සිනමාශාලාව
- දිනක් සිනමා - බොරලැස්ගමුව සිනමාශාලාව
- නාහම් යෝජිත සිනමාශාලාව - චුන්නාකම්
- රීගල් - යාපනය යෝජිත සිනමාශාලාව
- කොට්ටාව යෝජිත සිනමාශාලාව
- My Lan යෝජිත සිනමාශාලාව
- දෙණියාය නව මිණි සිනමාශාලාව
- යාපනය යෝජිත නව සිනමාශාලාව
- කේසෝන් - ජා ඇල
- ස්කයි ලයිට්ස් - මාලඹේ

14.3 නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.

විවෘත කරන ලද නව සිනමාශාලා

- රජිණ සිනමා - තඹුත්තේගම
- සිටි ලයින් සිනමා - ගල්කිස්ස

වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම

- ප්‍රජා සිනමා වැල්ලවාය

14.4 සිනමාශාලා පරික්ෂා කිරීම

පරික්ෂණ අංශයේ ප්‍රධාන රාජකාරි වන්නේ, සිනමාශාලා පරික්ෂා කිරීමයි. ඒ අනුව, දිවයිනේ සියළුම සිනමාශාලා වාර 1246 පරික්ෂා කරන ලදි.

සිනමාශාලා වල හිඟ මුදල් අයකර ගැනීම

සිනමාශාලා වලින් සංස්ථාවට අයවිය යුතුව තිබූ හිඟ මුදල් එකතුකර ගැනීම සඳහා කටයුතු කරන ලදි. ඒ අනුව දිවයිනේ සිනමාශාලා වලින් සංස්ථාවට අයවිය යුතුව තිබූ සංස්ථා භාරය හා චිත්‍රපට කුලිය වලින් රු.2,304,798.96 මුදලක් අයකර ගන්නා ලදි.

සිනමාශාලා වල සිදුවන අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම.

පරික්ෂණ නිලධාරින් විසින් සිනමාශාලා පරික්ෂා කිරීමේ දි විවිධ අක්‍රමිකතා හඳුනාගෙන ඇත. ඒ සඳහා සංස්ථා චක්‍රලේඛ පරිදි කටයුතු කරමින් 2015 වර්ෂය සඳහා රු.401,020/- වටිනාකමකින් යුතු හරපත්‍ර 132 ක් නිකුත් කර ඇත.

පෙර වර්ෂ වල නිකුත් කල හරපත්‍ර වලින් මෙම වසරේ අයකරගත් හරපත්‍ර 52 ක මුදල් රු.808,540/- කී.

14.5 විදේශ රූගත කිරීම් අධික්ෂණය

විදේශ රටවලින් ශ්‍රී ලංකාවට පැමිණෙන වෙළඳ දැන්වීම් , චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් රූගත කිරීම් අධික්ෂණ කටයුතු සිදුකරන ලදි. ඒ අනුව, 2015 වසර තුල උක්ත රූගත කිරීම් 37 ක් අධික්ෂණය කර ඇත.

15. සුභසාධනය

සංස්ථා සුභසාධනය සකසුරුවම් හා ණයදීමේ සමිතියේ කටයුතු, සමිතියේ සාමාජික සුභ සාධනය සඳහා මෙම වර්ෂය තුලද ක්‍රියාත්මක විය.

16. ක්‍රීඩා සංගමය

වර්ෂය තුල පහත කටයුතු සහ ජයග්‍රහණ සංගමය විසින් ලබාගෙන ඇත.

- සංස්ථා කාර්යය මණ්ඩල සහභාගි කර ගනිමින් අවුරුදු උත්සවය පැවැත්වීම
- ජනසතු සේවා එල්ලේ කැරම් තරඟ මාලාවට ක්‍රීඩකයින් සහභාගි කරවීම
- ජනසතු සේවා එල්ලේ තරඟ මාලාවට සහභාගි වී, බී කොටසේ ශූරතාවය දිනා ගැනීම
- අභ්‍යන්තර කැරම් තරඟ මාලාවක් පවත්වා ක්‍රීඩකයින් ශ්‍රේණිගත කිරීමේ කටයුතු සිදු කිරීම.
- කැරම් ක්‍රීඩාවට අවශ්‍ය ඉත්තන් ස්ටයිගර් ස්ටූල් 12 ක් ලබා ගැනීම.

17. ආගමික කටයුතු

17.1 බෞද්ධ සංගමය

- සංස්ථා සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් සඳහා අභ්‍යාස පොත් ලබා දීම.
- වෙසක්, පොසොන් උත්සවය නිමිත්තෙන් ධර්ම දේශනා පැවැත්වීම.
- වෙසක් උත්සවය නිමිත්තෙන් කොපි සහ බිස්කට් දන්සැලක් පැවැත්වීම
- සංස්ථා සේවක මහත්ම මහත්මීන්ට බෞද්ධ සංගමය විසින් පන්සිය පනස් ජාතක පොත පළමු කොටස ලබා දීම.
- සංස්ථා භූමිය තුල බුදු කුටියක් නිර්මාණය කර සංස්ථා සේවක මහත්ම මහත්මීන්ට ආගමික කටයුතු කිරීමට අවස්ථාවක් ලබාදීම.
- සංස්ථා සේවක මහත්ම මහත්මීන් සහ බෞද්ධ සංගමයේ දායකත්වයෙන් මරණයට කැප වූ ගවයන් දෙදෙනෙකු නිදහස් කිරීම.

17.2 ක්‍රිස්තියානි සංගමය

සංස්ථා කාර්ය මණ්ඩලයේ දූ දරුවන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික නත්තල් උත්සවය පැවැත් වීම.

18. වෛද්‍ය සහනාධාර ක්‍රමය

සාමාජික මුදල් හා සංස්ථාවෙන් ප්‍රදානය කරනු ලබන මුදල් මත පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සහනාධාර ක්‍රමය මෙම වර්ෂය තුල ද ක්‍රියාත්මක වූ අතර, එහි පාලන කමිටුව පහත පරිදි වේ.

සුනිල් වික්‍රමනායක මයා - කමිටු සභාපති

රංජනි පෙරේරා මිය - කමිටු සාමාජික (වැ.බ.ස.සාමාන්‍යාධිකාරි - පාලන හා මානව සම්පත්)

නාමල් වීරබාමු මයා - කමිටු සාමාජික (පරිපාලන නිලධාරි-පාලන හා මානව සම්පත්)

ආර්.පී.තිස්ස මයා - කමිටු සාමාජික (ලේකම් - ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය)

කේ.ආර්.වින්සන් මයා - කමිටු සාමාජික (නියෝජිත - ජාතික සේවක සංගමය)

සුබිත ඉලංගකෝන් මයා - කමිටු සාමාජික (සභාපති - චිත්‍රපට සංස්ථා සේවක සංගමය)

එච්.ඩී.අසංක ගුණතිලක මයා - කාර්යභාර නිලධාරි

19. වෘත්තිය සමිති

ජාතික සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය හා චිත්‍රපට සංස්ථා සේවක සංගමය මෙම වසර තුලදි ද පාලන අධිකාරිය සමග සහයෝගයෙන් කටයුතු කර ඇත.

20. ස්තුතිය

2015 වසරේ සාර්ථක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සංස්ථා කාර්ය මණ්ඩලය ඉතා වගකීමෙන් හා අප්‍රතිහත ධෛර්යෙන් යුතුව සිය සේවාවන් ඉටු කර ඇත. එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉමහත් සේ අගය කරන අතර ඔවුන් වෙත සිය ස්තුතිය කෘතිවේදීව පලකර සිටියි.



නීතිඥ දීපාල් චන්ද්‍රරත්න
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015.12.31 දිනට අවසන් වර්ෂය සඳහා
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

විස්තරය	සටහන	2015	2014	2015 ප්‍රදර්ශන	2015 චිත්‍රාගාරය	2015 නිෂ්පාදන	2015 පොදු පරිපාලන
		රු.	රු.	රු.	රු.	රු.	රු.
විකුණුම්	**03**	53,594,147	39,591,535	47,589,025	2,288,688	-	3,716,434
අඩු කළා : විකුණුම් පිරිවැය	**04**	2,866,206	7,341,871	-	149,384	-	2,716,822
දළ ලාභය		50,727,941	32,249,664	47,589,025	2,139,304	-	999,612
අඩු කළා : වියදම්							
සේවක පාරිශ්‍රමික	**05**	77,611,315	62,390,237	11,701,951	10,812,685	4,819,283	50,277,396
ගමන් හා යැපීම් දීමනා	**06**	429,651	808,155	2,318	16,206	500	410,627
සැපයුම් හා උපකරණ	**07**	6,145,388	7,028,356	4,950	1,681,174	12,935	4,446,329
අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම්	**08**	28,406,798	29,487,741	-	6,144,298	-	22,262,500
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා	**09**	14,386,447	18,496,419	368,708	1,866,123	900,893	11,250,723
බොල් ණය සඳහා හානිකරන ගැලපීම්		10,995,465	3,750,161	8,957,236	-	2,038,229	-
පාරිතෝෂික වෙන් කිරීම්		20,485,019	4,005,290	3,457,933	3,292,941	686,520	13,047,625
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම්		200,000	200,000	-	-	200,000	-
තොග හානි		-	21,143	-	-	-	-
		158,660,083	126,187,502	24,493,096	23,813,427	8,658,360	101,695,200
පොදු පරිපාලන වියදම් අන්තර්ග්‍රහණය කිරීම්		-	-	15,333,231	14,168,013	6,314,774	(35,816,018)
		158,660,083	126,187,502	39,826,327	37,981,440	14,973,134	65,879,182
මෙහෙයුම් ලාභය / අලාභය		(107,932,142)	(93,937,838)	7,762,698	(35,842,136)	(14,973,134)	(64,879,570)
එකතු කළා : වෙනත් ආදායම්	**10**	48,745,417	55,745,191				
වසරේ ලාභය /අලාභය		(59,186,725)	(38,192,647)				
එකතු කළා : භාණ්ඩාගාර ලැබීම්		80,000,000	75,000,000				
බදු පෙර ලාභය		20,813,275	36,807,353				
අඩු කළා : බදු සඳහා වෙන් කිරීම්		-	-				
ඌනතාවය / අතිරික්තය		20,813,275	36,807,353				

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2015 රු.	2014 රු.
නියෝජනය වන්නේ			
ස්ථාවර වත්කම්			
දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	**11**	356,557,037	368,801,813
දිගු කාලීන ආයෝජන	**12**	127,000	127,000
		356,684,037	368,928,813
ජංගම වත්කම්			
කෙටි කාලීන ආයෝජන	**13**	207,087,271	181,279,365
තොග	**14**	9,329,064	11,909,411
ණයගැතියෝ	**15**	140,875,826	123,136,192
විවිධ ණයගැතියෝ	**16**	159,015,837	149,472,335
තැන්පතු හා ඉදිරි ගෙවීම්	**17**	3,357,237	10,810,753
මුදල් හා බැංකු ශේෂය	**18**	67,844,504	21,578,961
		587,509,739	498,187,017
මුළු වත්කම්		944,193,776	867,115,830
යෙදවූ ප්‍රාග්ධනය			
අනුදත් ප්‍රාග්ධනය		10,000,000	10,000,000
සමුච්චිත ලාභය		334,063,659	314,730,054
වෙනත් සංචිත		123,482,759	123,482,759
		467,546,418	448,212,813
ජංගම නොවන වගකීම්			
ප්‍රදානයන්	**19**	146,944,856	136,862,813
පාරිතෝෂික වෙන් කිරීම්	**20**	49,392,704	34,060,813
		196,337,560	170,923,626
එකතු කළා : ජංගම වගකීම්			
තැන්පතු	**21**	2,474,227	2,484,227
චිත්‍රපට කුලී ණයහිමියෝ	**22**	242,661,692	208,610,799
වෙනත් ණයහිමියෝ	**23**	35,173,879	36,884,365
		280,309,798	247,979,391
මුළු වගකීම්		944,193,776	867,115,830

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව සකස් කර ඇත.

....

වැ. බ. නි. සාමාන්‍යාධිකාරී - මුදල් සභාපති අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ,
303 , බෞද්ධාලෝක මාවත ,
කොළඹ 07.

2016.05.30

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	හිමිකම් ප්‍රාග්ධනය රු.	සමුච්චිත ලාභය රු.	ප්‍රාග්ධන සංචිත රු.	ප්‍රත්‍යාගණන සංචිත රු.	වෙනත් සංචිත රු.	එකතුව රු.
2014.01.01 දිනට ශේෂය	10,000,000	277,922,702	499,898	115,153,399	7,829,462	411,405,461
වසරේ ලාභය	-	35,327,682	-	-	-	35,327,682
2014.12.31 දිනට ශේෂය	10,000,000	313,250,384	499,898	115,153,399	7,829,462	446,733,143
වසරේ ලාභය	-	20,813,275	-	-	-	20,813,275
2015.12.31 දිනට ශේෂය	10,000,000	334,063,659	499,898	115,153,399	7,829,462	467,546,418

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2015	2014
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්	රු.	රු.
බඳු අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය	(59,186,725)	(38,192,647)
(අඩු කළා)		
නිෂ්පාදන ණය මත පොළිය	(396,064)	-
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය	(11,111,070)	(10,267,443)
	(70,693,859)	(48,460,090)
මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයයන් සඳහා ගැලපීම		
ක්ෂයවීම්	21,160,625	20,762,242
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	20,485,019	4,005,290
අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන	10,995,465	3,750,161
නඩත්තු වියදම් ප්‍රතිපාදන	-	616,923
රාජ්‍ය ප්‍රදානයන් ආදායමට හඳුනා ගැනීම	(19,917,957)	(19,300,177)
වාහන ඉවත් කිරීමෙන් ලද ආදායම	-	(2,611,420)
ණය පොලී කපා හැරීම	-	211,878
	(37,970,707)	(41,025,193)
ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන්		
ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන් සඳහා ගැලපීම	(1,479,671)	4,598,518
කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	(39,450,378)	(36,426,675)
කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම්		
තොගය (අඩුවීම)	2,580,347	1,270,711
ණයගැතියෝ (වැඩිවීම)	(38,278,601)	(108,760,402)
තැන්පතු හා ඉදිරි ගෙවීම් (අඩුවීම)	7,453,516	(354,010)
තැන්පතු (වැඩිවීම)	(10,000)	37,500
ණයහිමියෝ (වැඩිවිම)	34,050,893	102,679,959
වෙනත් ණයහිමියෝ (අඩුවීම)	(1,710,483)	(1,049,236)
	(35,364,706)	(42,602,152)
අඩු කළා :		
පාරිතෝෂික ගෙවීම්	(5,153,128)	(2,169,965)
	(40,517,834)	(44,772,117)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
නිෂ්පාදන ණය පොලී	396,064	
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය	11,111,070	10,267,443
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	(8,915,851)	(15,146,200)
භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ආයෝජනය	(25,807,906)	(56,480,881)
ස්ථාවර වත්ක විකිණීමෙන් ලැබු මුදල්		4,535,556
භාණ්ඩාගාර ලැබීම්	110,000,000	93,100,000
මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශුද්ධ වැඩිවීම්	46,265,543	(8,496,199)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය	21,578,961	30,075,160
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය	**67,844,504**	**21,578,961**

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

සංස්ථාවේ කළමනාකරණය ,

1. සංස්ථාවේ ආදායම සහ වියදම වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළු මූල්‍ය ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීම පිළිබඳව ,

2. සංස්ථාවේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරීමක් සදහා , 1995 අංක. 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම පිළිබදව හා

3. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට හා වංචා සහ විෂමතා වැලැක්වීම සඳහා උචිත පියවර ගැනීම පිළිබඳව වගකිව යුතු වන්නේය.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය

---

1. **පොදු තොරතුරු**

1.1.1 පිහිටීම හා නීතිමය තත්ත්වය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව 1971 අංක. 47 දරන පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කොට පිහිටුවන ලදී. එහි ලියාපදිංචි කාර්යාලය , කොළඹ 07 , බෞද්ධාලෝක මාවතේ අංක.303 දරන ස්ථානයෙහි පිහිටියේය.

1.1.2 මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වරූපය

ශ්‍රී ලංකා චිත්‍රපට සංස්ථාව මූලිකවම ශ්‍රී ලංකාවේ චිත්‍රපට කර්මාන්තය ජගත් ප්‍රමිතීන්ට සමපාත වන සේ වර්ධනය කිරීමෙහිලා නිරතව සිටී.

1.1.3 නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය

මෙම මූල්‍ය ප්‍රකාශනයන් බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.07.01 දින අනුමැතිය දෙන ලදී.

1.2 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

1.2.1 අනුකූලතාව පිළබඳ ප්‍රකාශය

සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය , විස්තීර්ණ ආදායම , හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහිත සටහන් (මූල්‍ය ප්‍රකාශන) සකස් කරන ලද්දේ , ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය මඟින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) නියෝජනය වන පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූල වන පරිද්දෙනි.

1.2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ කළමනාකරීත්වය විසින් දරනු ලැබේ.

1.2.3. ගිණුම්කරණ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් උචිත හෙළිදරව් කිරීමක් කර ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කොට සකස් කර ඇත.

1.2.4 **අඛණ්ඩතාව**

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකරණය විසින් සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇත. සංස්ථාව , එහි මෙහෙයුම් පෙනෙන අනාගත කාලය තුළදී පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් සම්පත් තිබෙන බව විශ්වාසනීයව අපේක්ෂා කරයි. තිබෙන්නා වූ සියලු තොරතුරු සැලකිල්ලට ගත් විට ඉදිරියේදී සංස්ථාව ඇවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට හේතුවක් නොපෙනෙන අතර , අඛණ්ඩව පවත්නා ආයතනයක් සේ සලකා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.2.5 ක්‍රියාත්මක වීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

සංස්ථාවේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

1.2.6 වැදගත් වන ගිණුම්කරණ විනිශ්චයන් , ඇස්තමේන්තු සහ උපලේඛන

වාර්තා කරන දිනයේදී වාර්තා කරන ලද ආදායම් , වියදම් , වත්කම් සහ බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම පිළිබඳව වාර්තා කරන ලද සංඛ්‍යාවන්ට බලපාන විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් කිරීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට අවශ්‍ය වේ. කෙසේ වුවද , මෙම උපකල්පනයන්ගේ හා ඇස්තමේන්තු වල තිබෙන්නා වූ අවිනිශ්චිතභාවය හේතුවෙන් අනාගතයේදී වත්කම් හා බැරකම් වල පවත්නා

වටිනාකම් වල සැලකිය යුතු ගැලපීම් කිරීමට අවශ්‍ය වන්නා වූ බලපෑම් ඇතිවිය හැකිය. මෙම කාරණයන්හි විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් ඇතුළත් විය හැකිය.

ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම්හි සැලකිය යුතු ගැලපීම් කිරීමට සිදු වන්නා වූ , විශේෂිත අවදානම් ඇතිවිය හැකි , වාර්තා කරන දිනට පැවති අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පනයන් හා ඇස්තමේන්තු මූලාශ්‍රයන් පහත දක්වා ඇත.

(අ) මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය

ශේෂ පත්‍රයෙහි වාර්තා කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳ පොලේ ව්‍යුත්පන්න විය නොහැකි අතර , ඒවා වට්ටම් කළ මූල්‍ය ප්‍රවාහනයන් සහ / හෝ ගණිතමය ආකෘති ඇතුළු ශිල්ප ක්‍රම භාවිතා කරමින් නිශ්චය කර ඇත. මෙම ආකෘති වල යෙදවුම් , හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළෙඳ පොල දත්තයන්ද එවැනි දෑ නොමැති විට විනිශ්චය කිරීමෙන්ම ලබා ගන්නා ලදී.

මෙම සාධකයන් පිළිබඳ උපකල්පනයන්හි වෙනස්වීම් වාර්තා කර ඇති මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය කෙරෙහි බලපෑ හැකිය.

(ආ) **සාධාරණ අගය**

සාධාරණ අගය යනු දැනුමක් හා කැමැත්තක් ඇති පාර්ශව අතර අතේ දුරින් සිදු වූ ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි අගයයි. මූල්‍ය සාධන පත්‍රයක් මුලින්ම හඳුනා ගැනීමේදී එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් ගැනෙන්නේ ලැබූ හෝ ගෙවූ වටිනාකමයි. පසුකාලීනව මූල්‍ය වත්කමක සාධාරණ අගය වන්නේ සක්‍රීය වෙළඳපොලක ඉල්ලුම් කෙරෙන ලංසු තබන මිළයි. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ඉල්ලුම් කරන මිළයි. මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන සඳහා පවත්නා අගය වන්නේ සාධාරණ මිළයි.

2. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 **වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී හෝ වර්ෂයක් තුළ හෝ යන දෙකින් අඩු කාල සීමාවේදී මුදල් බවට උපලබ්ධි වන ඒවාය.

2.2 **මූල්‍ය සාධන පත්‍ර**

2.2.1 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

මූල්‍ය වත්කම් පහත සදහන් කොටස් වලට වර්ගීකරණය කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කළ දෑ , ණය සහ ලැබිය යුතු දෑ , කල් පිරෙන තුරු හෝ විකිණීමට තිබෙන දෑ , මෙම වර්ගීකරණය කළමනාකරණය විසින් නිර්ණය කරන ලද්දේ මූලික හඳුනා ගැනීම හා එම ආයෝජන අත්පත් කර ගැනීමේ අරමුණ පදනම් කොට ගෙනය.

2.2.2 වර්ගීකරණය , හඳුනා ගැනීම සහ මැනීම.

කළමනාකරණය විසින් එහි මූල්‍ය වත්කම් පහත සදහන් ලෙස වර්ගීකරණය කරයි.

අ. ණය සහ ලැබිය යුතු දෑ

ආ. විකිණීම සදහා ඇති දෑ

අ. ණය සහ ලැබිය යුතු දෑ

ස්ථාවර හෝ සක්‍රීය වෙළෙඳපොලේ මිළ ප්‍රකාශ නොවන , තීරණය වූ ගෙවීම් සහිත මූල්‍ය වත්කම්ය. මෙම වත්කම් මූලින්ම සාධාරණ වටිනාකමට එකතු වූ සෘජුවම අදාල වන ගණුදෙනු පිරිවැය හඳුනා ගනු ලැබේ. පසුකාලීනව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය කිරීමත් , යම් හානිකරණ පාඩුවක් වේනම් එයත් සැලකිල්ලට ගෙන මනිනු ලැබේ.

ආ. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු නිශ්චිත නොවූ කාල පරිච්ඡේදයක් තබා ගැනීමට අදහස් කරන , ද්‍රවශීලතා හේතු හෝ පොලී අනුපාත වෙනස්වීම මත , විනිමය අනුපාත වෙනස්වීම මත හෝ ස්කන්ධ මිළ මත විකිණීමට අවශ්‍ය විය හැකි හෝ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර නොමැති කල් පිරෙන තුරු තබා ගන්නා හෝ ලාභ හෝ අලාභ මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්ය.

2.2.3 සාධාරණ අගය නිශ්චය කිරීම.

ණය සහ අත්තිකාරම් මෙන්ම වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීමේදී වර්තමාන අගය ආකෘතිය එකඟ වූ මුදල් ප්‍රවාහයන් පදනම් කොට ගෙන ණයෙහි ගුණාත්මකභාවයද , ද්‍රවශීලතාව හා පිරිවැයද සැලකිල්ලට ගෙන නිර්ණය කෙරේ. වෙළෙඳ ලැබිය යුතු හා ගෙවිය යුතු අයිතම වල ආසන්න සාධාරණ අගය ලෙස සැලකෙන්නේ පවත්නා වටිනාකමින් හානිකරණය සඳහා අඩු කළ පසු ඉතිරියයි.

2.2.4 ප්‍රති වර්ගීකරණය

ණය හා ලැබිය යුතු දැහැර මූල්‍ය වත්කම් , වෙලදාම සඳහා අයිතමයන්ගෙන් වෙන් කොට වර්ගීකරණය කිරීමට ඉතා කලාතුරකින් ඇතිවිය හැකි පරිසරයකදී හුදෙකලා සිදුවීමක් ලෙස අවසර දෙනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ අතරින් වෙලදාම සඳහා වූ දේ ලෙස ප්‍රති වර්ගීකරණය කිරීම සංස්ථාව විසින් ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අදාළ වන්නේනම් ප්‍රතිවර්ගීකරණය තොරා ගනු ඇත.

ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එසේ කරන දිනට ඇති සාධාරණ අගයටයි. සාධාරණ අගය වන්නේ නව පිරිවැය හෝ ක්‍රමක්ෂය පිරිවැය මතය.

2.2.5 හානිකරණය

(අ) ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍ය වත්කම්

එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වී ඇති බවට වන සාක්ෂි සංස්ථාව විසින් අගය කෙරේ. වත්කමෙහි ආරම්භක හඳුනා ගැනීමෙන් පසු ඇති වූ අවස්ථා එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස (දරන ලද අලාභ අවස්ථා) අගය අඩුවීමක පරමාර්ථ සාක්ෂියක් තිබේනම් සහ එම අලාභ අවස්ථාවට මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ හෝ විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තුගත කළ හැකි මූල්‍ය වත්කම් කාණ්ඩයක් මත බලපෑමක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වූ බවට සලකනු ලැබේ. අගය අඩුවන බවට වන සාක්ෂි ලෙස , ණයකරුවෙකු හෝ ණයකරුවන් කාණ්ඩයක් සැලකිය යුතු මූල්‍ය දූෂ්කරතා වලට මුහුණ දෙමින් සිටින බව පෙන්වීම , පොළියෙහි හෝ මුලධන ගෙවීම් වල පැහැර හැරීම් , ඔවුන් බංකොළොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඇති හැකියාව සහ පැහැර හැරීම් සමග සහසම්බන්ධිත ආර්ථික තත්ත්ව හෝ හිඟ මුදල් වල වෙනස්වීම් වැනි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල ඇගයිය හැකි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි දත්ත මින් පෙන්වීම , ඇතුළත් විය හැකි වේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් සඳහා , තනි තනි වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනි වශයෙන් අගය අඩුවීම්හි පරමාර්ථ සාක්ෂි තිබේදැයි සංස්ථාව විසින් පළමුවෙන් තනි තනි වශයෙන් අගයන අතර , තනි තනි වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමුහිකව අගයයි. වැදගත් වුවත් , නොවුවත් තනි තනි වශයෙන් අගයනු ලැබූ මූල්‍ය වත්කමක අගය අඩුවීම පිළිබඳ පරමාර්ථ සාක්ෂියක් නොමැති බව සමූහය විසින් නිශ්චය කළහොත් එය , එම වත්කම සමාන බැර අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩයක ඇතුළත් කරන අතර ඒවා අගය අඩුවීම සඳහා සාමුහිකව අගයනු ලැබේ.

අගය අඩුවීම සඳහා තනි තනි වශයෙන් අගයනු ලැබූ සහ අගය අඩුවීමක් සහිත හෝ දිගින් දිගටම හඳුනා ගැනීමට නියමිත වත්කම් අගය අඩුවීමෙහි සාමුහික ඇගයීමට ඇතුළත් කරනු නොලැබේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ වත්කම් මත අගය අඩුවීමේ අලාභ දරා ඇති බවට පරමාර්ථ සාක්ෂියක් ඇති විට , වත්කමෙහි පවතින වටිනාකම සහ මූල්‍ය වත්කමෙහි මුල් ඵලදායි පොළි අනුපාතිකයට වට්ටම්ගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල වර්තමාන වටිනාකම (නොදරන ලද

අනපේක්ෂිත අනාගත ණය අලාභ හැර) අතර වෙනසින් අලාභයෙහි ප්‍රමාණය අගයනු ලැබේ. ණයක් සඳහා වෙනස් වන පොලී අනුපාතියක් පවතී නම් . යම් අගය අඩුවීමේ අලාභයක් ඇගයීම සඳහා වට්ටම්ගත අනුපාතය වන්නේ වර්තමාන ඵලදායි පොලී අනුපාතයයි. වත්කමෙහි පවතින වටිනාකම දීමනා ගිණුමක් භාවිතා කිරීම හරහා අඩු වන අතර , හානිවන ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. පොලී ආදායම . අඩු වු පවතින වටිනාකම මත එක්රැස් වීම පවත්වා ගෙන යනු ලබන අතර එය අගය අඩු වීමේ අලාභ ඇගයීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම්ගත කළ පොලී අනුපාතය භාවිතා කරමින් එක් රැස් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයෙහි ආයෝජන ආදායම් වල කොටසක් ලෙස පොලී ආදායම වාර්තා කරනු ලැබේ. අනාගත අය කර ගැනීමෙහි තාත්වික අපේක්ෂාවන්ක නොමැති විට ආශ්‍රිත දීමනා සමඟින් ණය කපා හරිනු ලබන අතර , සියලු සුරැකුම් සමුහයට උපලබ්ධි කර හෝ පවරාගෙන ඇත. ආසන්න වර්ෂයකදී අගය අඩුවීම හඳුනා ගැනීමෙන් පසු යම් හේතුවක් නිසා ඇස්තමේන්තුගත අගය අඩුවීමේ අලාභය වැඩි වේ නම් හෝ අඩු වේනම් දීමනා ප්‍රමාණය සීරුමාරු කර පෙර හඳුනා ගනු ලැබූ අගය අඩුවීමේ අලාභය වැඩි හෝ අඩු කරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව අය කර ගතහොත් එම අය කිරීම ආදායම් ප්‍රකාශනයෙහි දීමනා (Allowance) ගිණුමට ගලපනු ලැබේ.

(ආ) අනෙකුත් මුල්‍යමය නොවන වත්කම් හානිකරණය

වත්කමක පවත්නා අගය අය කර ගත නොහැකි බව පෙනෙන පරිසරයකදී හානිකරණය සඳහා විමසා බැලීමට යටත් වේ. පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ.

2.2.6 හඳුනා ගැනීම අත් හැරීම.

මුල්‍ය වත්කමක් (හෝ කොටසක් හෝ සමුහයක කොටසක් ඇතුලුව) හඳුනා ගැනීම අත් හරින අවස්ථා මෙසේය.

- මුල්‍ය ප්‍රවාහයන් ලැබීමේ අයිතිය ඉකුත් වීම.

- සංස්ථාව විසින් වත්කම මඟින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය පැවරීම හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් තුන්වන පාර්ශවයකට පවරා දිය යුතු යැයි උපකල්පනය කිරීම.

(අ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීම.

(ආ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීමක් හෝ රඳවා ගැනීමක් නොකොට පාලන අයිතිය පැවරීම.

2.2.7 නීතිමය අයිතියක් ඇති අවස්ථා වල මූල්‍ය වත්කම් හා වගකීම් සමාහරණය කොට ශුද්ධ අගය දක්වා ඇත.

2.3. <u>දේපළ , යන්ත්‍ර හා උපකරණ</u>

2.3.1 <u>හඳුනා ගැනීම හා මැනීම.</u>

දේපළ , යන්ත්‍ර හා උපකරණ අයිතමයන් ඒවායේ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ තක්සේරු අගයට පෙන්වා ඇත. පිරිවැය තුළ වත්කම අත් කර ගැනීමේදී දැරූ වියදම් වලින් ඍජුවම අදාල වන වියදම් ඇතුලත් වේ. ස්වයං නිර්මිත වත්කම් වල එම වත්කම් භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ ද්‍රව්‍යය පිරිවැය , ඍජු ශ්‍රමය , ඍජුවම බලපාන වෙනත් අදාල වියදම් ඇතුළත් වේ. අළුත්වැඩියා හා ඉදිරි අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් දරන ලද වියදම් ඒවා දරන අවස්ථාවේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

2.3.2 <u>පසුකාලීන පිරිවැය</u>

උපාංග ප්‍රතිපූර්ණය සඳහා දරන ලද වියදම වෙන් වෙන්ව එනම් පුළුල් පරීක්ෂාවන් හා පූර්ණ අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනගත කෙරෙන්නේ ඒවායේ ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හේතු වන්නේනම් හා එම ප්‍රතිලාභ විශ්වාසදායකව මැනිය හැකි නම්ය. දෛනික සේවා කිරීම් ඒවා දරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

2.3.3 <u>ක්ෂය වීම්</u>

ක්ෂය සඳහා වෙන් කිරීම සරල මාර්ග ක්‍රමය අනුව පිරිවැය / තක්සේරු අගය මත ගණනය කෙරේ. ඉඩම් හැර දේපළ , යන්ත්‍ර හා උපකරණ පහත දැක්වෙන ප්‍රතිශත නඅවු ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී ශේෂය ගණනය කෙරේ.

ගොඩනැගිලි	-	ප්‍රධාන කාර්යාලය	2.5%
	-	ශ්‍රවණාගාරය	5%
චිත්‍රපට සංකීර්ණය	-	ගොඩනැගිලි	5%
	-	අනෙකුත් යන්ත්‍ර සූත්‍ර	10%
ලී බඩු සවි කිරීම්			25%
මෝටර් රථ			25%
චිත්‍රපට සංරක්ෂණාගාරය			10%
සංස්කෘතික / අධ්‍යාපනික / චිත්‍රපට උපකරණ			10%
චිත්‍රපට උපකරණ			10%
සුභසාධන උපකරණ			10%

දේපළ පිරියත හා උපකරණ මිළදී ගත් දිනෙන් ආරම්භව ක්ෂය කරනු ලැබේ.

2.3.4 හඳුනා ගැනීම ඉවත් කිරීම.

දේපළ , පිරියත සහ උපකරණ අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ ඒවායින් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම නතර වේ. දේපළ , පිරියත හා උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය හඳුනා නොගන්නා විට අදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කරනු ලැබේ.

2.3.5 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීමක කිසියම් ඇඟවීමක් තිබේදැයි නිශ්චය කිරීම සඳහා විලම්භිත බඳු වත්කම් හාර සමූහයෙහි මූල්‍යමය නොවන වත්කම් වල පවතින වටිනාකම් ඒ ඒ වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලැබේ. එවැනි තත්ත්වයක් ඇත්නම් , එවිට වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. අවිනිශ්චිත ඵලදායි ආයු කාලයක් සහිත හෝ මේ වන තෙක් භාවිතය සඳහා නොපවතින අස්පෘශ්‍ය වත්කම් සඳහා අය කර ගත හැකි වටිනාකම එක් එක් වර්ෂයේදී එම අවස්ථාවේදීම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක

හෝ මූල්‍ය උත්පාදක ඒකකයක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ. භාවිතයේ ඇති වටිනාකම (Value in use) ඇගයීමේදී , මුදලෙහි කාලීන අගයෙහි වර්තමාන වෙළෙඳපොල ඇගයීම පිළිබිඹු කරනු ලබන බදු පෙර වට්ටම් අනුපාතයක් සහ වත්කමට හෝ මූල්‍ය උත්පාදක ඒකකයට විශේෂිත අවදානම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ.

අගය අඩුවීම පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා තනි තනිව පරීක්ෂා කළ නොහැකි වත්කම් වෙනත් වත්කම් වලින් මුදල් ගැලීමෙන් විශාල වශයෙන් නිදහස් වන නොකඩවා පාවිච්චියෙන් මුදල් ගැලීම උත්පාදනය කරනු ලබන කුඩාම වත්කම් කාණ්ඩයකට කාණ්ඩගත කරනු ලැබේ. අගය අඩුවීමේ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

2.4 <u>තොග</u>

සියළු තොග පිරිවැය හෝ ශුද්ධ ප්‍රත්‍යාගණන අගය යන දෙකින් අවමයට අගය කෙරේ. පිරිවැය පළමු ඇතුළු - පළමු පිට (FIFO) ක්‍රමය පදනම් කොටගෙන තීරණය කෙරේ.

2.5 <u>ආදායම් බදු</u>

සංස්ථා සේවකයන්ගේ පඩි හා අනෙකුත් දීමනාද , වියදම් වලින් කොටසක් පියවීම සඳහාද , භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙනු ලැබේ. භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් සඳහා බදු නොගෙවිය යුතුය යන පදනම මත බදු ගෙවීම සඳහා වෙන් කිරීමක් කර නොමැත.

සංස්ථාව විසින් වාර්ෂිකව ලැබූ ලාභය ආදායම් බදු ගෙවීමෙන් පසු ඇති වූ අතිරික්තයෙන් 25% ක ප්‍රමාණයක් ලාභය වෙනුවෙන් බදු ගෙවිය යුතුය යන්න අපගේ මතය වන අතර , එම ප්‍රමාණය විය යුත්තේ ආදායම් බදු සඳහා සිදු කළ ගැලපුම් කටයුතු වලින් පසු ඉතිරි ශුද්ධ ලාභය යන්න අපගේ විශ්වාසයයි.

2.6 <u>අනෙකුත් වත්කම්</u>

අනෙකුත් වත්කම් වල අනෙකුත් ණයගැතියන් සහ ලැබිය යුතු දෑ , අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවීම් , ලැබිය යුතු බදු ඇතුළත් වේ.

(අ) <u>අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවූ වියදම්</u>

එක් මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලාභ ලැබෙතැයි පෙනෙන යම් සබඳවායක් ඇති වියදම් අත්තිකාරම් , තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කරන ලදී. එවැනි වියදම් කාල පදනම මත අදාළ කාල පරිච්ඡේදය තුළ කපා හරිනු ලැබේ.

(ආ) <u>අනෙකුත් ණයගැතියෝ</u>

අනෙකුත් ණයගැතියන් පිරිවැයෙන් හානිකරණය අඩු කළ වටිනාකමට හඳුනාගෙන ඇත.

2.7 <u>මුදල් සහ මුදල් හා සමාන දෑ</u>

ඒවායේ සාධාරණ අගයෙහි වෙනස්වීමට නොසැලකිය යුතු තරමේ අවදානමකට භාජනය වන අත්පත් කර ගත් දින සිට මාස 03 ක් කල් පිරුණු හෝ ඊට අඩු කල් පිරීමක් සහිත සහ සමූහය විසින් එහි කෙටිකාලීන වගකීම් කළමනාකරණය සඳහා යොදා ගන්නා මුදල් ශේෂ සහ ඉල්ලුම් තැන්පතු වලින් මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වේ.

2.8 <u>මූල්‍ය වගකීම්</u>

2.8.1 <u>ආරම්භක හඳුනා ගැනීම හා මැනීම.</u>

LKAS 39 අනුව මූල්‍ය වගකීම් වර්ග කොට ඇත්තේ , උචිත පරිදි ලාභය හෝ අලාභය මඟින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම් හෝ ණය හෝ ණයට ගැනීම්ය. සංස්ථාව එහි මූල්‍ය වගකීම් ආරම්භක හඳුනා ගැනීම අනුව වර්ගීකරණය නිශ්චය කර ඇත. සියළු මූල්‍ය වගකීම් මුලින්ම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර , ණය හා ණය ගැනුම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය ක්‍රමය භාවිතා කරයි. මෙහි සෘජුවම අදාළ වන ගනුදෙනු පිරිවැය ඇතුළත්ය.

සංස්ථාවේ මූල්‍ය වගකීම් වල වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුලත්ය.

2.8.2 <u>පසුකාලීන මිනුම්</u>

මූල්‍ය වගකීම් මිනුම පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

2.8.3 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් වල වෙළදාම සඳහා වූ මූල්‍ය වගකීම් සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් මත නම් කරන ලද ඒවා ඇතුළත් වේ. මූල්‍ය වගකීම් , වෙළදාම සඳහා පවත්නා දේ ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා නුදුරේදී විකිණීමේ අරමුණ ඇත්නම්ය. වෙළදාම සඳහා වගකීම් මත ලැබීම් හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. සංස්ථාව කිසිදු මූල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මූලික හඳුනා ගැනීම නම් කර නැත.

2.9 අනෙකුත් මූල්‍ය වගකීම්

ණය සහ ණය ගැනුම් ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අනෙකුත් මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ක්‍රමාක්ෂය ක්‍රමය භාවිතා කරයි.

2.10 අනෙකුත් වගකීම්

අනෙකුත් වගකීම් වල උපචිත වියදම් ද ඇතුලත්ය. මේවා ඒවායේ සාධාරණ අගය ලෙස සැලකෙන ඓතිහාසික වටිනාකමට දක්වා ඇත.

2.11 රජයේ ප්‍රදාන

වත්කම් වලට අදාළ රජයේ ප්‍රදාන මේවා ශේෂ පත්‍රයේ විලම්භනය කර අදාළ වත්කමේ ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබන අතර , වියදම් පියවීම සඳහා ලැබෙන්නා වූ ලැබීම් , ලැබීම් පදනම මත ගිණුම්ගත කෙරේ.

2.12 සේවක ප්‍රතිලාභ

නිර්ණය කළ දායක සැලැස්ම

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි ප්‍රකාර , සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයෝ හිමිකම් ලබති. සංස්ථාව විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත ස්ථාවර දායකයක් මෙකී අරමුදල් වලට ගෙවන අතර , ඉන් අමතරව නීතිමය හෝ හෝ අර්ථකාරී බැදීමක් සංස්ථාව කෙරෙහි නොමැත.

නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වෙනස් වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැලසුමක් වේ. මේ සම්බන්ධව 1983 අංක. 12 දරන පාරිතෝෂික පනත යටතේ සංස්ථාව බැඳී සිටී.

2.13 <u>ආදායම</u>

2.13.1 <u>නිෂ්පාදක ණය පොලිය හා අධි භාරය</u>

නිෂ්පාදකයින් වෙත ලබා දී ඇති ණය මුදල් සඳහා පොළිය ගිණුම්ගත කර ඇත්තේ අදාළ චිත්‍රපට ප්‍රදර්ශනය වී අවුරුද්දක් ගත වන තෙක් පමණි. යම් අවස්ථාවක ණය මුදල් සම්පූර්ණ අය වන්නේනම් අදාල පොලියද ගණනය කර අය කිරීමට කටයුතු කරනු ලැබේ.

සිනමාශාලා වලින් අය වීමට ඇති මුදල් සඳහා ගැසට් නිවේදනයේ පරිදි අධිභාරය ගණනය කර ගිණුම්ගත කර තිබේ.

2.13.2 <u>ප්‍රදර්ශනය සඳහා මුදා හැර ඇති චිත්‍රපට</u>

චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේදී ආදායම නොලැබීම මත ණය මුදල් අය නොවීමේ තත්ත්වයක් තුළ චිත්‍රපට මුදා හැර මාස 06 කට පසු පොළිය ගිණුම්ගත කරනු නොලැබේ.

2.13.3 <u>ප්‍රදර්ශනය නොවූ චිත්‍රපට</u>

(අ) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබා දී ඇති එහෙත් පසුගිය වර්ෂ දෙකක සේවාවන් ලබාගෙන නොමැති චිත්‍රපට වලට පොළිය ගිණුම්ගත කර නොමැත.

(ආ) චිත්‍රාගාර සේවා ලබා දීමේදී දීර්ඝ කාලයක් තුළ සේවාවන් ලබා නොගෙන නිෂ්පාදන කටයුතු නවතා ඇති චිත්‍රපට සඳහා පොළිය ගිණුම්ගත කොට නොමැත.

ඉහත සඳහන් කරුණු 02 යටතේ වර්ෂයේ පොළිය ගණනය නොකලද , යම් අවස්ථාවක මෙම ණය මුදල් අය කර ගැනීමේදී පොළිය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.13.4 සිනමාහල් අධිභාර

සිනමාශාලා වලින් ලැබිය යුතු චිත්‍රපට කුළිය සඳහා අයවිය යුතු අධිභාර මුදලින් 100% ක් නොලැබේය යන පදනම මත 25% ක් පමණක් ආදායමට ගෙන තිබේ.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

		2015	2014
(03) විකුණුම්		රු.	රු.
එළිය කැවූ චිත්‍රපට	**3.1**	47,198,999	28,337,822
ප්‍රදර්ශන	**3.2**	390,026	364,188
චිත්‍රාගාරය	**3.3**	2,288,688	1,481,969
වෙළඳ කටයුතු	**3.4**	3,716,434	9,407,556
		53,594,147	39,591,535

3.1 එළිය කැවූ චිත්‍රපට

	2015	2014
දේශීය චිත්‍රපට කුළිය	34,166	9,854
පෙරදිග චිත්‍රපට කුළිය	-	-
බෙදා හැරීමේ කොමිස්		
දේශීය	18,889,785	10,567,571
විදේශීය	16,653,226	8,495,208
වැඩිවීම	7,789,740	5,630,449
සේවාවන් සඳහා කොමිස්	148,724	116,093
අධිභාරය	3,253,073	3,061,887
පරීක්ෂණ දඩ මුදල්	430,285	456,760
	47,198,999	28,337,822

3.2 ප්‍රදර්ශන

	2015	2014
සිනේ ඇඩ්ස්	390,026	364,188
	390,026	364,188

3.3 චිත්‍රාගාරය

	චිත්‍රපට ප්‍රමාණය	2015	චිත්‍රපට ප්‍රමාණය	2014
ශබ්ද	45	2,133,488	21	1,208,906
සංස්කරණය	7	155,200	17	273,063
රසායනාගාරය (කළු - සුදු)	-	-	-	-
		2,288,688		1,481,969

3.4 වෙළඳ කටයුතු

	ප්‍රමාණය	2015	ප්‍රමාණය	2014
සිනමා කාබන්	45,950	2,307,960	45,250	2,496,080
අමතර කොටස්	-	21,168		5,507,545
ලිපි ද්‍රව්‍යය	-	1,342,237		1,185,398
අභ්‍යන්තර භාවිතය				
අමතර කොටස් -		6,100		20,840
ලිපි ද්‍රව්‍යය පිරිවැය		38,969		197,693
		3,716,434		9,407,556

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

(04) විකුණුම් පිරිවැය

	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	පොදු පරිපාලන වියදම්	2015 එකතුව	2014 එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
තොගය 2015.01.01	5,253,887	1,824,580	8,130,875	15,209,342	23,858,948
එකතු කළා :					
මිලදී ගැනීම් හා මාරු කිරීම්	-	-	3,025,486	3,025,486	1,469,916
	5,253,887	1,824,580	11,156,361	18,234,828	25,328,864
අඩු කළා :					
තොග පාඩුවීම්	-	-	-	-	3,185
මාරු කිරීම්	-	-	-	-	-
2015.12.31 අවසන් තොගය	5,253,887	1,675,196	8,439,539	15,368,622	17,983,808
	-	149,384	2,716,822	2,866,206	7,341,871
	5,253,887	1,675,196	8,439,539	15,368,622	17,986,993

දීර්ඝ සටහන් සඳහා (4- ඒ) , (4-බී) සහ (4- සී) සටහන් බලන්න.

<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව</u>
<u>2015.12.31 දිනට අවසන් වර්ෂයේ</u>
<u>ආදායම් ප්‍රකාශන සඳහා සටහන්</u>

(04 - A) <u>විකුණුම් පිරිවැය</u>

	තොගය 2015.01.01	මිලදී ගැනීම්	එකතුව	තොගය 2015.12.31	ක්ෂයවීම්	ප්‍රචාරණය	මුළු පිරිවැය	වැඩිවීම	බෙදාහැරීමේ ලැබීම්	මුළු ලැබීම්	ලාභය / අලාභය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
<u>එළිය කැවූ චිත්‍රපට</u>											
දේශීය	3	-	3	3	-	-	-	3,488	30,678	-	34,166
බටහිර	244	-	244	244	-	-	-	-	-	-	-
පෙරදිග	471	-	471	471	-	-	-	-	-	-	-
	718	-	718	718	-	-	-	3,488	30,678	-	34,166
<u>මුදා නොහල චිත්‍රපට</u>											
දේශීය	3,043,931	-	3,043,931	3,043,931	-	-	-	-	-	-	-
බටහිර	982,492	-	982,492	982,492	-	-	-	-	-	-	-
පෙරදිග	8	-	8	8	-	-	-	-	-	-	-
එකතුව	4,026,431	-	4,026,431	4,026,431	-	-	-	-	-	-	-
	4,027,149	-	4,027,149	4,027,149	-	-	-	3,488	30,678	-	34,166

			2015		**2014**
			රු.		රු.
තොගය 2015.01.01			-		-
<u>එකතු කළා :</u>	මිලදී ගැනීම්		-		-
	ප්‍රචාරණය		-		-
			-		-
<u>අඩු කළා :</u>	තොගය				
	2015.12.31		-		-
	පිරිවැය		-		-
<u>එකතු කළා:</u>	අනෙකුත් චිත්‍රපට				
තොගය 2015.01.01					
I. ප්‍රතිශත පදනම මත		259,890		259,890	
II. සිනේ සිත්තම්		966,848	1,226,738	966,848	1,226,738
<u>එකතු කළා :</u>	වියදම්		-		-
			1,226,738		1,226,738
<u>අඩු කළා :</u>					
	මාරු කිරීම්				
තොගය 2015.12.31					
I. ප්‍රතිශත පදනම මත		259,890	-	-	-
II. සිනේ සිත්තම්		966,848	1,226,738	-	1,226,738
මුළු පිරිවැය			-	-	-

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

(04 - B) විකුණුම් පිරිවැය

	දළ සේයාපට	සිනමා කාබන්	අමතර කොටස්	රසායන ද්‍රව්‍යය	ලිපි ද්‍රව්‍යය	එකතුව 2015	එකතුව 2014
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක තොගය 2015.01.01	287,951	2,130,804	3,298,200	-	2,413,920	8,130,875	16,769,843
එකතු කළා :							
මිලදී ගැනීම් හා මාරු කිරීම්	-	1,630,183	-	-	1,395,303	3,025,486	1,469,916
	287,951	3,760,987	3,298,200	-	3,809,223	11,156,361	18,239,759
අඩු කළා :							
තොග හානිවීම	-	-	-	-	-	-	3,185
2015.12.31 අවසන් තොගය	287,951	2,193,458	2,775,688	-	3,182,442	8,439,539	10,905,341
	-	1,567,529	522,512	-	626,781	2,716,822	7,331,233
	287,951	2,193,458	2,775,688	-	3,182,442	8,439,539	10,908,526

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන් (චිත්‍රාගාරය)

(04 - C) විකුණුම් පිරිවැය

	දළ සේයාපට	සිනමා කාබන්	අමතර කොටස්	රසායන ද්‍රව්‍යය	එකතුව 2015	එකතුව 2014
	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක තොගය	816,569	-	953,921	54,090	1,824,580	1,835,218
2015.01.01						
මිලදී ගැනීම්	-	-	-	-	-	-
	816,569	-	953,921	54,090	1,824,580	1,835,218
අඩු කළා :						
තොග හානිවීම	-	-	-	-	-	-
මාරු කිරීම	-	-	-	-	-	-
2015.12.31 අවසන් තොගය	816,569	-	804,537	54,090	1,675,196	1,824,580
වර්ෂය තුළ අභ්‍යන්තර පාවිච්චිය	-	-	149,384	-	149,384	10,638

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 05

	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	නිෂ්පාදන	පොදු පරිපාලන වියදම්	එකතුව 2015	එකතුව 2014
	රු.	රු.	රු.	රු.	රු.	රු.
සේවක පාරිශ්‍රමිකය						
වැටුප් හා වේතන	4,977,610	3,944,065	2,079,280	19,345,713	30,346,668	29,776,949
අතිකාල , නිවාඩු පඩි හා වන්දි	529,867	875,367	66,715	1,657,878	3,129,827	3,646,942
සේවක අර්ථසාධක හා භාරකාර අරමුදලට දායක මුදල්	822,248	598,361	311,964	2,699,148	4,431,721	4,301,233
වෙනත් දීමනා	5,372,226	5,394,892	2,361,324	26,574,657	39,703,099	24,665,113
	11,701,951	**10,812,685**	**4,819,283**	**50,277,396**	**77,611,315**	**62,390,237**

සටහන : 06

	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	නිෂ්පාදන	පොදු පරිපාලන වියදම්	එකතුව 2015	එකතුව 2014
ගමන් හා යැපීම් දීමනා						
ගමන් වියදම් (දේශීය)	1,393	3,881	-	141,389	146,663	136,836
(විදේශීය)	-	-	-	-	-	344,551
යැපීම් දීමනා	925	12,325	500	269,238	282,988	326,768
	2,318	**16,206**	**500**	**410,627**	**429,651**	**808,155**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2015.12.31 දිනට අවසන් වර්ෂයේ

ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 07

	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	නිෂ්පාදන	පොදු පරිපාලන වියදම්	එකතුව 2015	එකතුව 2014
	රු.	රු.	රු.	රු.	රු.	රු.
සැපයුම් හා උපකරණ						
ලිපි ද්‍රව්‍යය හා කාර්යාලීය උපකරණ	4,950	44,045	12,935	927,568	989,498	1,439,820
විදුලිය	-	1,544,299	-	3,113,540	4,657,839	5,072,399
සංග්‍රහ වියදම්	-	-	-	313,481	313,481	464,325
යාන්ත්‍රික හා විදුලි උපකරණ	-	92,830	-	-	92,830	51,812
නිල ඇඳුම්	-	-	-	91,740	91,740	-
	4,950	1,681,174	12,935	4,354,589	6,145,388	7,028,356

සටහන : 08

	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	නිෂ්පාදන	පොදු පරිපාලන වියදම්	එකතුව 2015	එකතුව 2014
අළුත්වැඩියා කිරීම් , නඩත්තු හා ක්ෂයවීම්						
ඉන්ධන, ලිහිසි තෙල් හා රථවාහන නඩත්තු	-	-	-	3,184,127	3,184,127	1,451,673
නඩත්තු	-	195,432	-	3,866,614	4,062,046	7,273,826
ක්ෂයවීම්	-	5,948,866	-	15,211,759	21,160,625	20,762,242
	-	6,144,298	-	22,262,500	28,406,798	29,487,741

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 09

	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	නිෂ්පාදන	පොදු පරිපාලන වියදම්	එකතුව 2015	එකතුව 2014
	රු.	රු.	රු.	රු.	රු.	රු.
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවාවන්						
ප්‍රවාහනය	90,868	-	-	32,573	123,441	910,050
සම්බන්ධතා	274,451	199,620	234,190	953,980	1,662,241	1,693,745
අවශ්‍යතා	3,389	-	-	4,167,484	4,170,873	3,644,013
වරිපනම් බදු	-	62,569	-	609,840	672,409	784,889
වෙනත් සේවා	-	1,603,934	666,703	5,486,846	7,757,483	11,251,844
සේවක ණය පොලී පිරිවැය	-	-	-	1,055,679	1,055,679	1,182,551
(-) සේවක ණය පොලී ආදායම	-	-	-	(1,055,679)	(1,055,679)	(1,182,551)
නිෂ්පාදන ණය පොලී කපා හැරීම්	-	-	-	-	-	211,878
	368,708	1,866,123	900,893	11,250,723	14,386,447	18,496,419

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2015.12.31 දිනට අවසන් වර්ෂයේ

ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 10

වෙනත් ආදායම්

	2015	2014
	රු.	රු.
නිෂ්පාදන ණය පොලී	396,064	4,767,640
සේවක ණය පොලී	411,068	420,908
විවිධ ආදායම්	783,290	1,782,712
පිටස්තර රූගත කිරීම්	2,429,418	2,849,245
සංස්ථාවට අයත් නොවන චිත්‍රපට අළුත්වැඩියා කිරීම් සඳහා	1,814,824	1,961,046
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොලී	11,111,070	10,267,443
අයදුම්පත් ගාස්තු	260,000	212,000
එන්. එෆ්. සී. සිනමාහලේ ආදායම	2,656,250	3,315,000
රක්ෂණ සංස්ථාවෙන් වන්දි ලැබීම්	-	-
චිත්‍රපට නැරඹීම සඳහා ලැබීම්	750	8,000
තිරනාටක සඳහා අනුමැතිය	5,000	15,000
224 ගොඩනැගිලි කුලී ආදායම	7,740,000	7,740,000
පාඨමාලාවන් සඳහා ලැබීම්	1,176,400	294,600
ප්‍රක්ෂේපණ යන්ත්‍ර ලබා දීම	-	200,000
භාණ්ඩාගාර ලැබීම් ආදායමට හදුනා ගැනීම්	19,917,957	19,300,177
වාහන ඉවත් කිරීමේ ගිණුම	-	2,611,420
විනිමය අනුපාත ගැලපීම	43,326	
	48,745,417	55,745,191

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 11 - ස්ථාවර වත්කම්

දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	පිරිවැය	වර්ෂය තුල එකතු කිරීම්	වර්ෂය තුල ඉවත් කිරීම්	පිරිවැය	සමුච්චිත ක්ෂයවීම්	වර්ෂය සඳහා ක්ෂයවීම්	සමුච්චිත ක්ෂයවීම්	ශුද්ධ අගය
	2015.01.01			2015.12.31	2015.01.01			2015.12.31
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ඒ. 01. සින්නක්කර ඉඩම්	174,343,458	-	-	174,343,458	-	-	-	174,343,458
02. සින්නක්කර ගොඩනැගිලි	131,911,054	3,433,248	-	135,344,302	38,776,150	5,124,632	43,900,782	91,443,520
03. තාවකාලික ගොඩනැගිලි	6,080,387	-	6,080,387	-	-	-	-	-
04. සිනමා සංකීර්ණය	104,928,508	-	-	104,928,508	42,163,279	7,061,919	49,225,197	55,703,311
05. මිනි සිනමා උපකරණ	331,451	-	-	331,451	331,449	-	331,449	2
06. ලී බඩු , සවි කිරීම් හා වැඩ්දූම්	16,468,347	77,760	-	16,546,107	15,140,845	220,612	15,358,578	1,187,529
07. කාර්යාලීය උපකරණ	16,619,129	893,666	-	17,512,795	13,450,272	719,267	14,172,419	3,340,376
08. මෝටර් රථ	15,297,820	50,000	-	15,347,820	9,761,740	1,857,857	11,619,598	3,728,222
09. චිත්‍රපට සංරක්ෂණය	1,610,655	-	-	1,610,655	867,808	97,279	965,087	645,568
10. පාපැදි	18,281	-	-	18,281	18,277	-	18,277	4
11. චිත්‍රපට උපකරණ	910,689	-	-	910,689	565,710	49,280	614,990	295,699
12. ප්‍රක්ෂේපණ උපකරණ	480,202	-	-	480,202	447,603	5,709	453,312	26,890
13. චිත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර	88,813,583	4,461,177	-	93,274,760	61,988,655	5,948,866	67,937,521	25,337,239
14. සිනමා අධ්‍යාපන උපකරණ	1,241,350	-	-	1,241,350	660,928	75,204	736,132	505,218
15. සුභසාධන උපකරන	194,961	-	-	194,961	194,960	-	194,960	1
	559,249,875	8,915,851	6,080,387	562,085,339	184,367,676	21,160,625	205,528,302	356,557,037

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2015	2014
	රු.	රු.
සටහන : 12		
දිගු කාලීන ආයෝජන		
සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම	127,000	127,000
	127,000	127,000
සටහන : 13		
කෙටි කාලීන ආයෝජන		
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සේවක	5,000	5,000
ස්ථාවර තැන්පතු	16,826,422	15,955,241
රිපෝ තැන්පතු	104,667,166	83,977,782
භාණ්ඩාගාර බිල්පත්	85,588,683	81,341,342
	207,087,271	181,279,365
සටහන : 14		
තොග		
චිත්‍රපට	5,253,887	5,253,887
වෙළඳ කටයුතු	8,151,588	10,905,341
චිත්‍රාගාරය	1,675,196	1,824,580
චිත්‍රාගාරය නඩත්තු අමතර කොටස්	1,472,575	1,472,575
ලිපි ද්‍රව්‍යය හා වෙනත්	1,372,994	1,050,204
	17,926,240	20,506,587
සෙමින් අලෙවි වන සහ අලෙවි නොවන තොග සඳහා වෙන් කිරීම්	(8,597,176)	(8,597,176)
	9,329,064	11,909,411
සටහන : 15		
ණයගැතියෝ		
සිනමාහල්	176,366,114	141,370,156
නිෂ්පාදකයෝ	101,027,511	114,694,335
	277,393,625	256,064,491
අඩු කළා :-		
ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම(සටහන 15 ඒ)	(136,517,799)	(132,928,299)
	140,875,826	123,136,192
සටහන : 16		
විවිධ ණයගැතියෝ		
වෙනත්	148,119,293	130,126,139
විවිධ ණයගැතියෝ සඳහා හානිකරන ගැලපීම(සටහන 15 ඒ)	(7,405,965)	-
සේවක අත්තිකාරම්	18,302,509	19,346,196
සේවක ණය වත්කම් ගිණුම	5,569,131	7,634,829
(-) සේවක ණය වගකීම් ගිණුම	(5,569,131)	(7,634,829)
	159,015,837	149,472,335

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

අඩමාන ණය සඳහා වෙන් කිරීම් උපලේඛනය

සටහන : 15 ඒ

ණයගැතියෝ	එකතුව 2015	එකඟ නොවූ හා අය කර ගත නොහැකි	අය කර ගත හැකි	5% වෙන් කිරීම්	මුළු වෙන් කිරීම්
	රු.	රු.	රු.	රු.	රු.
සිනමාහල්	176,366,114	66,089,856	110,276,258	5,513,812	71,603,668
නිෂ්පාදකයන්	101,027,511	63,013,427	38,014,084	1,900,704	64,914,131
වෙනත්	148,119,293	-	148,119,293	7,405,965	7,405,965
සේවක අත්තිකාරම්	18,302,509	-	18,302,509	-	-
	443,815,427	129,103,283	314,712,144	14,820,481	143,923,764

	එකතුව	සිනමාහල්	නිෂ්පාදන	වෙනත්	සේවක අත්තිකාරම්
	රු.	රු.	රු.	රු.	රු.
ශේෂය ඉ / ගෙ	132,928,299	69,709,908	62,875,902	342,489	-
ලාභාලාභ ගිණුමට මාරු කළා	10,995,465	1,893,760	2,038,229	7,063,476	-
	143,923,764	71,603,668	64,914,131	7,405,965	-

ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම්

2015.01.01 දිනට	132,928,299
ලාභාලාභ ගිණුමට මාරු කළා	10,995,465
ශේෂය ප / ගෙ 2015.12.31	143,923,764

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2015	2014
	රු.	රු.
සටහන : 17		
තැන්පතු හා ඉදිරියට ගෙවීම්		
තැන්පතු	3,691,450	6,371,892
අත්තිකාරම් ගෙවීම්	315,915	5,132,069
සුහසාධක සංගමයට අත්තිකාරම් ගෙවීම්	31,000	10,000
	4,038,365	11,513,961
නොලැබිය හැකි ණය සඳහා හානිකරන ගැලපීම	(681,128)	(703,208)
	3,357,237	10,810,753
සටහන : 18		
මුදල් හා බැංකු ශේෂ		
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-1-0208647	681,468	294,980
මහජන බැංකුව - ජ. ගි. අ. 055-1-001-5-0667533	873,874	502,730
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-6-0208664	8,059,708	1,064,374
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323272	10,456,100	2,496,651
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323131	537,256	276,439
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323354	41,475,925	8,442,131
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323363	5,707,301	8,444,520
ලංකා බැංකුව - ජ. ගි. අ. 0005002189	23,023	25,073
	67,814,655	21,546,898
අත ඉතිරි මුදල්		
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය	28,171	27,876
සුළු මුදල් - චිත්‍රාගාරය	1,644	4,153
සුළු මුදල් - චිත්‍රපට ගබඩාව	34	34
	29,849	32,063
එකතුව	67,844,504	21,578,961
සටහන : 19		
ප්‍රදානයන්		
භාණ්ඩාගාර ප්‍රදානයන්	166,862,813	156,162,990
(-)ක්‍රමක්ෂය	19,917,957	19,300,177
	146,944,856	**136,862,813**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2015 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2015	2014
	රු.	රු.
සටහන : 20		
ඉදිරියට ගෙනා ශේෂය - 2015.01.01	34,060,813	32,225,488
වර්ෂය සඳහා වෙන් කිරීම්	20,485,019	4,005,290
මුදල් ගෙවීම්	(5,153,128)	(2,169,965)
	49,392,704	34,060,813

(භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇත.)

සටහන : 21

තැන්පතු

	2015	2014
එන්.එෆ්.සී. සිනමාශාලා ඇප තැන්පතු	60,000	90,000
ආපනශාලා තැන්පතු	30,000	10,000
ආරක්ෂක තැන්පතු - සිනමාශාලා	2,326,727	2,326,727
සේවක	5,000	5,000
චිත්‍රපට ආනයන	7,500	7,500
සිනමා ව්‍යාපෘතිය	45,000	45,000
	2,474,227	2,484,227

සටහන : 22

චිත්‍රපට කුලී ණයහිමියෝ

	2015	2014
චිත්‍රපට කුලී ණයහිමියෝ	260,708,496	226,657,603
(-) ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම	(18,046,804)	(18,046,804)
	242,661,692	208,610,799

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2015 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 23

	2015	2014
	රු.	රු.
වෙනත් ණයහිමියෝ		
උපචිත වියදම්	5,953,251	6,434,329
ගෙවිය යුතු එකතු කල අගය මත බදු	152,613	152,613
විගණන ගාස්තු ප්‍රතිපාදන	1,486,720	986,720
දේශීය ආදායම් කොමසාරිස් (මුද්දර)	43,030	44,380
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල	-	-
හිමිකම් නොපෑවේතන	1,025,537	889,824
සේවක අර්ථසාධක අරමුදල	663,353	665,928
සේවක භාරකාර අරමුදල	73,858	74,209
විවිධ ණයහිමියෝ	2,005,794	1,518,910
(-) නොගෙවිය යුතු වගකීම් සඳහා වෙන් කිරීම්	(644,840)	(644,840)
විවිධ ණයගැතියෝ (බැර ශේෂය)	1,245,505	1,257,674
චිත්‍රපට කුලී ණයගැතියෝ	3,477,940	3,704,237
මහා භාණ්ඩාගාරය	5,000,000	5,000,000
ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල	3,525,795	3,569,113
රිත්මා මණ්ඩල පාලන ගිණුම	-	2,078,307
සිනේ තරු පුංචි තාරකා	31,750	31,750
චිත්‍රපට උත්සව සඳහා වෙන් කිරීම් ගිණුම	5,000,000	5,000,000
උපයන විට බදු ගෙවීම	37,939	25,577
වැටුප් හා වේතන වෙන් කිරීමේ ගිණුම	714,182	714,182
ලැබිය යුතු නිෂ්පාදන ණය පොලී වෙන් කිරීම	5,381,452	5,381,452
	35,173,879	**36,884,365**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2015 දෙසැම්බර් 31 දිනට

ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

වෙනත් සේවා	එකතුව 2015	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	නිෂ්පාදන	පොදු පරිපාලන වියදම්
	රු.	රු.	රු.	රු.	රු.
අධ්‍යක්ෂක ගාස්තු	188,550	-	-	-	188,550
ප්‍රචාරණය	274,475	-	-	-	274,475
විශේෂ කොමිෂන් ගාස්තු	93,536	-	-	-	93,536
නීති ගාස්තු	791,112	-	-	-	791,112
සංස්ථා උලෙලයන්	384,480	-	-	-	384,480
විගණන ගාස්තු	500,000	-	-	-	500,000
ආරක්ෂක සේවා	4,497,885	-	1,603,934	-	2,893,951
බැංකු ගාස්තු	70,085	-	-	-	70,085
විවිධ වියදම්	20,815	-	-	-	20,815
සිනමා අධ්‍යාපන	666,703	-	-	666,703	-
පිටස්තර මරණාධාර හා සිනමා ශිල්පීය වියදම්	185,600	-	-	-	185,600
නව සිනමාහලේ වියදම්	59,803	-	-	-	59,803
පාරිතෝෂික දඩ මුදල	9,920	-	-	-	9,920
විනිමය අනුපාත ගැලපීම	-	-	-	-	-
තිර නාටක කියවීම	-	-	-	-	-
චිත්‍රපට නැරඹීම	3,000	-	-	-	3,000
ප්‍රමාද ගාස්තු	5,038	-	-	-	5,038
ටෙන්ඩර් වියදම්	6,480	-			6,480
ස්ථාවර වත්කම් ඉවත් කිරීම	1	-			1
	7,757,483	-	1,603,934	666,703	5,486,846

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015 දෙසැම්බර් 31 දිනට
ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

	එකතුව 2015	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	නිෂ්පාදන	පොදු පරිපාලන වියදම්
	රු.	රු.	රු.	රු.	රු.
ප්‍රවාහනය	123,441	90,868	-	-	32,573
සම්බන්ධතා	1,662,241	274,451	199,620	234,190	953,980
අවශ්‍යතා					
අභ්‍යන්තර පාවිච්චිය	45,069	3,389	-	-	41,680
විදේශීය චිත්‍රපට උළෙල	47,152	-	-	-	47,152
සුභසාධක වියදම්	2,950,815	-	-	-	2,950,815
සේවක බඳවා ගැනීම් හා පුහුණුව	947,231	-	-	-	947,231
ජල බිල්පත්	180,606	-	-	-	180,606
	4,170,873	3,389	-	-	4,167,484
වරිපනම් බදු	672,409	-	62,569	-	609,840

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015.12.31 දිනට අවසන් වර්ෂයේ
විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2014.12.31 දිනට අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

	SLFRS 2014 රු.	මැනිය හැකි වෙනස්වීම් රු.	SLFRS 2014 රු.
විකුණුම්	39,591,535	-	39,591,535
අඩු කළා : විකුණුම් පිරිවැය	7,341,871	-	7,341,871
දළ ලාභය	32,249,664	-	32,249,664
අඩු කළා : වියදම්			
සේවක පාරිශ්‍රමික	62,390,237	-	62,390,237
ගමන් හා යැපීම් දීමනා	808,155	-	808,155
සැපයුම් හා උපකරණ	7,028,356	-	7,028,356
අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම්			
(ඒ) අළුත්වැඩියා කිරීම් හා නඩත්තු ක්ෂයවීම්	29,487,741	-	29,487,741
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා	18,496,419	-	18,496,419
බොල් ණය සඳහා වෙන් කිරීම්	3,750,161	-	3,750,161
පාරිතෝෂික වෙන් කිරීම්	4,005,290	-	4,005,290
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම්	200,000	-	200,000
තොග හානි	21,143	-	21,143
	126,187,502	-	126,187,502
පොදු පරිපාලන වියදම් අන්තර්ග්‍රහණය කිරීම්	-		-
	126,187,502	-	126,187,502
මෙහෙයුම් ලාභය / අලාභය	(93,937,838)	-	(93,937,838)
එකතු කළා : වෙනත් ආදායම්	55,745,191	(1,479,672)	54,265,519
වර්ෂයේ ලාභය / අලාභය	(38,192,647)	(1,479,672)	(39,672,319)
අඩු කළා : භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්	75,000,000	-	75,000,000
	36,807,353	(1,479,672)	35,327,681
අඩු කළා : බදු සඳහා වෙන් කිරීම්	-	-	-
ඌනතාවය / අතිරික්තය	**36,807,353**	**(1,479,672)**	**35,327,681**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015 දෙසැම්බර් 31 දිනට
සටහන්

සටහන අංක. 01

(I) වැඩියෙන් ගිණුම්ගත කර ඇති නිෂ්පාදන ණය පොලිය ඉවත් කිරීම.	(32,600.31)
(II) දඩ පොලී ඉවත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක. 11343.1.1/5940 අනුව	(392,700.00)
(III) නිෂ්පාදන ණය එකවර ගෙවීම නිසා ඉදිරියට ගිණුම්ගත කර තිබූ පොලිය ඉවත් කිරීම.	(1,538,035.25)
(IV) නාමෙල් මාලනී සිනමාහලට ප්‍රක්ෂේපණ යන්ත්‍ර මිලදී ගැනීමේදී ටෙන්ඩර් වියදම් ගිණුමට ගිණුම්ගත කිරීම නිවැරදි කිරීම.	1,000.00
(V) 2014 වර්ෂයේ අත්තිකාරම් වශයෙන් ගෙවූ මුදලක ඉතිරිය වර්ෂයේ වියදම් ගිණුමට ගිණුම්ගත කිරීම.	2,600.00
(VI) සුභසාධක සංගමයට මරණාධාර අත්තිකාරම් ගෙවූ මුදල පියවීම වියදම් ගිණුමට ගිණුම්ගත කර තිබීම නිවැරදි කිරීම.	1,500.00
(VII) 2014 උපචිත කර තිබූ වියදම අඩුවෙන් ගෙවීම	3,374.51
(VIII) 2014 වර්ෂයේ ජල ගාස්තු වියදම දෙවතාවක් ගිණුම්ගත කිරීම.	22,800.00
(IX) DTS Sound විකුණුම් මිල ගණනය කිරීමට පෙර භාණ්ඩ විකිණීම නිසා වැඩියෙන් මිල කල මුදල	(41,155.84)
(X) 2011 වැඩිපුර උපචිත කර ඇති මුදල ඉවත් කිරීම	493,545.35
	(1,479,671.54)

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2015 දෙසැම්බර් 31 දිනට

ඇමුණුම

		ප්‍රමිත අංකය	වටිනාකම රුපියල්
තොගය			
2011 වැඩියෙන් මිල කර තිබීම ඉවත් කිරීම		LKAS 39	**41,155.84**
ණයගැතියෝ			
අනුමැතිය ලත් දඩ පොලී සහ නිෂ්පාදන ණය ඉවත් කිරීම		LKAS 39	
	32,600.31		
	392,700.00		
	1,538,035.25		
	(1,000.00)		**1,962,335.56**
වෙනත් ණයගැතියෝ			
අත්තිකාරම් ගැලපීම		LKAS 39	
	2,600.00		
	1,500.00		**4,100.00**
වෙනත් ණයහිමියෝ			
නොගෙවිය යුතු ණයහිමියන්			
	3,374.51		
	493,545.35		
	22,800.00		**519,719.86**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2015 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 24

අධ්‍යක්ෂක මණ්ඩල සබඳතා

ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් තීරණ වලට බලපෑම් සිදු කළ හැකි කිසිදු ගණුදෙනුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර නොමැත. 2015 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් පහත දක්වා ඇත.

අංකය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම	පත් කල දිනය	දරන තනතුර හා සේවා ස්ථානය / ලිපිනය	ලිපිනය	සම්බන්ධිත පාර්ශවයන්ගේ ගණුදෙනුවේ ස්වභාවය
1	නීතිඥ දීපාල් චන්ද්‍රරත්න මහතා	2015.03.11	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති සභාපති - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	සභාපති , ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව. කොළඹ 07.	-
2	සම්පත් සුබසිංහ ආරච්චි මහතා		ක්‍රියාකාරී අධ්‍යක්ෂක - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	ක්‍රියාකාරී අධ්‍යක්ෂක , ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව. කොළඹ 07.	-
3	ආචාර්ය එස්. කේ. එම්. ඩී. දර්ශනී ගුණතිලක	2015.05.14	අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික (නිල බලයෙන්) ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂක , රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, කොළඹ 05.	-
4	එන්. ගොඩකන්ද මහත්මිය	2015.03.26	භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂ ජනරාල් - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ ජනරාල් , මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය , කොළඹ 01.	-
5	නයන හෙට්ටිආරච්චි මහතා	2015.04.06	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක.330/8 , සමන් මාවත , වැවපාර , බොරලැස්ගමුව.	-
6	පී. වී. පි. දයාරත්න මහත්මිය	2015.02.06	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක. 59/3 , හීනටිකුඹුර , තලංගම උතුර , බත්තරමුල්ල.	-
7	විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක මහතා	2015.05.14	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක. 182/1 , හිල් විදිය , දෙහිවල.	-
8	අමල් අල්විස් මහතා	2015.05.14	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක 262, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.	-

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : සීඒඑස්/ඊ/එන්එෆ්සී/1/15/20   ඔබේ අංකය / உமது இல. / Your No. :   දිනය / திகதி / Date : 2017 මැයි 23 දින

D.G.M. (Finance)

NATIONAL FILM CORPORATION OF SRI LANKA 29 MAY 2017 CHAIRMAN'S OFFICE

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව NATIONAL FILM CORPORATION OF SRI LANKA 02 AUG 2017 පාලන අංශය Administration Division

සභාපති,

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව NATIONAL FILM CORPORATION OF SRI LANKA 21 JUN 2017 මුදල් අංශය FINANCE DIVISION

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

පිටපත් :- 1. ලේකම් , පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

2. ලේකම් , මුදල් අමාත්‍යාංශය.

නි/සා/මුදල් අංශය 31 MAY 2017 ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සීඑස්/ඊ/එන්එෆ්සී/1/15/20   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2017 මැයි 23 දින

29 MAY 2017

සභාපති,
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 31(1) වගන්තිය සමඟ සංයෝජිතව ක්‍රියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම් සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික චිත්‍රපට සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7

ප්‍රමිතයේ ඡේද අංක 44 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් චලනය සඳහා බලනොපාන විෂයයන් ගැලපීමේදී,ඉකුත් කාල පරිච්ඡේදයට අදාළ වැරදි නිවැරදි කිරීම් රු.1,479,671 ක් ගලපා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළ වූ රු. 43,326 ක විනිමය අනුපාත වෙනස්වීම ගැලපීම් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(i) ප්‍රමිතය ප්‍රකාරව නිෂ්කාර්ය වත්කම් පිළිබඳව ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවත් සංස්ථාවේ චිත්‍රාගාරයේ කලුසුදු සහ වර්ණ රසායනාගාරවලට අයත් තාක්ෂණය යල්පැනගිය පැරණි වත්කම් ගිණුම්ගත කිරීම හා ඒ පිළිබඳව හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

(ii) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 250,899,989 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20

රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබූ අතර 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙළින් ප්‍රදාන වටිනාකමින් සියයට 12.35 හා සියයට 11.93 බැගින් ක්‍රමක්ෂය කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38

සරසවි චිත්‍රාගාරයේ පශ්චාත් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන මෘදුකාංගය අස්පෘශ්‍ය වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම් උපලේඛන අනුව තොග හානි වශයෙන් හඳුනාගෙන තිබූ රු. 944,186 ක් සහ විගණනයේදී හඳුනා ගන්නා ලද හානි වූ රු.175,000 ක් වටිනා කාබන් කූරු 2500 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා අවසන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සාමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද රු. 50,000 ක සුබෝපභෝගී බදු මුදල් වියදම් ලෙස ගිණුමගත කළ යුතු වුවත් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට ස්ථාවර තැන්පතු පොලිය මත අයකරන ලද රු. 3,180,320 ක රඳවාගැනීමේ බදු, වියදමක් ලෙස සටහන් නොකර වත්කමක් ලෙස සටහන් කිරීම නිසා වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ගිණුම්ගත කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,245,505 ක ණයගැති ශේෂයන් හා රු.8,926,642 ණයහිමි ශේෂයන් වැඩිවෙන් දක්වා තිබුණි.

2.2.3 පැහැදිළි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විෂයයන් 04 කට අදාළව විගණනය වෙත ලබාදුන් උපලේඛනයන්/ලෙජර් ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් ශේෂයන් අතර රු.18,113,637 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ ගිණුම් අනුව සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.3,525,795 ක් ඇති අතර සංවර්ධන අරමුදලේ ලෙජරය අනුව ලැබිය යුතු වටිනාකම රු.5,642,590 ක් ලෙස සටහන් කර තිබුණි. රු.2,116,795 ක මෙම වෙනස හඳුනා ගෙන නිවැරදි කිරීමට ක්‍රියාකර නොතිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත දැක්වෙන එක් එක් විෂයන්ට අදාලව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණයට ඉදිරිපත් කර නොතිබුණි.

	විෂයය	වටිනාකම (රු.)	ඉදිරිපත් නොවූ සාක්ෂි
(අ)	සංවර්ධන සංචිතය	7,827,785	සංචිතය ඇති කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය
(ආ)	චිත්‍රපට උත්සවය සඳහා වෙන්කිරීම	5,000,000	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය විස්තරාත්මක උපලේඛන
(ඇ)	චිත්‍රපට කුලී ණයගිම්යෝ හර ශේෂය	8,926,642	විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ, කාල විශ්ලේෂණ
(ඈ)	සිනමාශාලා ණයගැතියෝ බැර ශේෂය	3,477,940	විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ, කාල විශ්ලේෂණ

(ඉ)	ආපසු ලැබිය යුතු තැන්පතු	773,728	තැන්පතු උපලේඛන
(ඊ)	හිමිකම් නොපෑ වේතන	387,231	විස්තරාත්මක උපලේඛන
(උ)	චිත්‍රාගාර නඩත්තු අමතර කොටස්	1,472,572	මිලදීගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ,ඉන්වොයිස්, තොග ලේඛණ

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 වර්ෂයේ සිනමා ශාලාවල චිත්‍රපට බෙදා හැරීමේ කටයුතු පෞද්ගලික මණ්ඩලවලට පැවරීමට පෙර සිනමා ශාලා 163 කින් රු. 7,604,528 ක් හා පැවරීමෙන් පසු පැවති එහෙත් දැනට වසා දමා ඇති සිනමාශාලා 186 කින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු හිඟ මුදල රු. 74,412,984 ක් විය.

(ආ) දැනට ක්‍රියාත්මක වන මණ්ඩලවලට අයත් සිනමාශාලා වලින් අයවිය යුතු හිඟ මුදල රු. 149,054,764 ක්වූ අතර. සමාලෝචිත වර්ෂයේදී ද එකී මුදල් අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි.

(ඇ) සංස්ථා නිලධාරීන්ට ලබා දී තිබුණ රු.651,815 ක ණය වසර 5 ට වඩා වැඩි කාලයක් ගත වුවද අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ඉ) වසර 5කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.69,303,374 ක් වූ විවිධ ණයගැති ශේෂ අයකරගෙන නොතිබුණි.

2.4 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 371(2)	දෙන ලද අත්තිකාරම් අදාල කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත් 2015 වර්ෂයේ සංවර්ධන අරමුදලට ලබා දී තිබුණ රු. 666,590 ක අත්තිකාරම් 2016 අගෝස්තු 31 වන විටත් පියවා නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 381(1)	රාජකාරි බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මගින් මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත්, 2015 දෙසැම්බර් 31 වන විට එකතුව රු. 67,915,601 ක් වූ සංස්ථා බැංකු ගිණුම් 09 ක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ආ) 2015 මැයි 25 දිනැති පීඩී 2/2015 චක්‍රලේඛයේ 04 ඡේදය	ජංගම දුරකථන ලබා දීම සඳහා දැරීමට සිදුවන පිරිවැය අදාළ නිලධාරියා විසින් දැරිය යුතු අතර අදාළ ආයතනය විසින් ප්‍රතිපූරණය නොකළ යුතුය.එසේ වුවද සංස්ථාව විසින් නිලධාරින්ට ජංගම දුරකථන 12 ක් ලබාදීම සඳහා 2010 වර්ෂයේ සිට 2015 දක්වා රු. 254,114 ක් වැයකර තිබුණි.
(ඇ) 2015 ජූලි 22 දිනැති අමප/05/0741/041/012 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය	රාජ්‍ය ආයතනවලින් බැහැර කෙරෙන තඹ, පිත්තල, ඇලුමිනියම්, ඊයම් ආදී යකඩ නොවන ලෝහද විශේෂ වර්ගයන්හි යකඩ, වීනච්චට්ටි, හා වානේ සුනුබුන්ද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අලෙවිකල හැකි වුවත් සරසවි චිත්‍රාගාරයේ පැරණි ගොඩනැගිල්ලක යකඩ, සුන්බුන් හා දළසේයාපට ආවරණ ගොඩගසා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.20,813,275 ක අතිරික්තයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.36,807,353 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,994,078 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. වෙනත් අදයම්වල රු. 6,999,774 කින් පහත වැටීම සහ සේවක පාරිශ්‍රමික හා පාරිතෝෂික වෙන්කිරීම් රු.15,221,078 කින් වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී රු.2,417,937 ක අතිරික්තය උච්චාවචනයන් සහිතව 2015 වර්ෂය අවසානයට රු.20,813,275 ක් ලෙස වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේ දී 2011 වර්ෂයේ දායකත්වය රු. 100,218,715 ක් වූ අතර 2015 දී රු. 119,585,215 දක්වා වර්ධනය වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 2.1:1 ක් වුවත් ජංගම වත්කම්වල ඇතුළත් විවිධ ණයගැතියන් තුළ වර්ෂ 05 ට වැඩි පැරණි ණයගැති ශේෂ රු.69,303,374 ක් ඇතුළත් වීමෙන් ණය අයකර ගැනීමේ කාර්යක්ෂමතාවයක් නොමැති බව හා ද්‍රවශීලතාවයක් නොමැති බව නිරීක්ෂණය විය.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 කාර්යසාධනය

1971 අංක 47 දරණ ජාතික චිත්‍රපට සංස්ථා පනත අනුව චිත්‍රපට නිෂ්පාදනය හා ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය පටල පට, චිත්‍රපට, ඡායාරූප උපකරණ ආනයනය, බෙදා හැරීම හා සැපයීම, චිත්‍ර පට මිලට ගැනීම හා ගබඩා කිරීම ඇතුළුව චිත්‍රපට අපනයනය කිරීම සහ චිත්‍රපට නිෂ්පාදනය සඳහා චිත්‍රාගාර හා චිත්‍රපට ප්‍රදර්ශනාගාර පිහිටුවීම, පහසුකම් සැපයීම හා මූල්‍ය වශයෙන් සහය වීම, චිත්‍රපටවල නිෂ්පාදකයන්ට උපහාර දැක්වීම, ත්‍යාග හා සම්මාන ප්‍රදානය කිරීම, සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම හා පැවැත්වීම, චිත්‍රපට උළෙල පැවැත්වීම, චිත්‍රපට පිළිබඳ වාර සඟරා එළ කිරීම හා ශ්‍රී ලංකාව ඇතුළත හා ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපල පර්යේෂණ පැවැත්වීම ආදී අරමුණු ඉටුකර ගැනීම සඳහා සංස්ථාව පිහිටුවා ඇත. ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) චිත්‍රපට කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, එය දිරිමත් කිරීම සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන චිත්‍රපට උසස් ප්‍රමිතියකින් පවත්වාගෙන යාමේ අරමුණින් චිත්‍රපට ක්ෂේත්‍රයේ සිටින්නන් සඳහා සහ චිත්‍රපට සම්බන්ධ අධ්‍යාපනය ලබන අය සඳහා බෙදාහැරීම සඳහා මුද්‍රණය කරන ලද සඟරා 10,047 ක් 2016 සැප්තැම්බර් 15 වන විටත් ගබඩාවේ දක්නට තිබුණි.

(ආ) සිනමා කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ මූලික අරමුණින් චිත්‍රපට නිෂ්පාදනයෙහිලා මූල්‍යමය සහය දැක්වීම අරමුණක් වුවත් 2012 වර්ෂයේ සිට කිසිදු නිෂ්පාදන ණයක් ලබා දී නොතිබූ අතර ශ්‍රී ලංකාව ඇතුලත හා ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපල පර්යේෂණ පැවැත්වීම ආදී අරමුණු ඉටුකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) ආයතනයේ අරමුණු ඉටුකරගැනීමට සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 66.84 ක් වෙන්කර තිබූ අතර 2015 දෙසැම්බර් 31 වනවිට එයින් රු.මිලියන 3.7ක් පමණක් භාවිතාකර තිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත්කර තිබූ ක්‍රියාකාරකම්වලින් සියයට 28.5 (56 න් 16) ක් ක්‍රියාත්මක කර නොතිබුණ අතර ඉටුකල ක්‍රියාකාරකම්වලින් සියයට 35.7 (20) ක් ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) චිත්‍රපට කර්මාන්තය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට නියමිත ඒකකයක් සංස්ථාව තුළ ස්ථාපනය කර නොතිබුණු අතර, ප්‍රේක්ෂකයන්ගෙන් හා චිත්‍රපට නිෂ්පාදකයින්ගෙන් චිත්‍රපට කර්මාන්තය පිළිබඳ සංස්ථාවට ලැබෙන පැමිණිලි ලේඛනගත කිරීම සංස්ථාවේ කිසිදු අංශයකින් සිදුකර නොතිබුණි. තවද පැමිණිලි අදාළ අංශ වෙත යොමුකර කාලීනව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ අවධානය යොමුකර නොතිබූ අතර චිත්‍රපට කර්මාන්තයේ උන්නතිය උදෙසා ජාතික ප්‍රතිපත්ති සැකසීමට ද කටයුතු කර නොතිබුණි. එසේම ශ්‍රී ලාංකීය සිනමාවේ අනන්‍යතාවය රැකගනිමින් ජාත්‍යන්තර තත්ත්වයට ළඟාවිය හැකි නිර්මාණ බිහි කිරීම සංස්ථාවේ දැක්ම වුවත්, අවශ්‍ය මූල්‍යමය පහසුකම් ලබා නොදීම මත නවක නිෂ්පාදකවරු හට ඉදිරියට ඒමට බාධාවන් පැන නගින අතර, හරවත් නිර්මාණ බිහි කිරීම වෙනුවට වානිජමය චිත්‍රපටවලට යොමුවී මුදල් ඉපයීම ප්‍රධාන අරමුණ බවට පත් වී තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සරසවි චිත්‍රාගාරයේ චිත්‍රපට පශ්චාත් නිෂ්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2015 වර්ෂයට රු.30,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී තිබූ අතර ඒ සඳහා ලංසු කැඳවා , ඒවා සංස්ථාවේ පිරිවිතරවලට නොගැලපෙන හෙයින් පසුව අවලංගු කර තිබුණි. එසේ වුවද නැවත අවශ්‍ය පිරිවිතර සැකසීම හා ඉදිරි කටයුතු වෙනුවෙන් ඉන්දියානු උපදේශකවරයෙකුට රු.1,145,840 ක් 2015 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණද 2016 සැප්තැම්බර් 30 දින වනවිටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(ආ) දේශීය චිත්‍රපට කර්මාන්තය නගා සිටුවීම සඳහා චිත්‍රපට නිෂ්පාදනය කිරීම වෙනුවෙන් ණය ලබාදීමේ ක්‍රමයක් හඳුන්වා දී තිබුණද නිෂ්පාදන ප්‍රගතිය සමාලෝචනය කිරීමකින් තොරව එකවර මුළු ණය මුදලම ලබාදීම සහ ණය අයකර ගැනීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදී තිබුණු රු.95,474,170 ක ණය මුදලින් ප්‍රදර්ශනය නොකළ චිත්‍රපට සඳහා ලබාදී තිබූ රු.14,271,266 ක් ද ප්‍රදර්ශනය සඳහා මුදාහළ චිත්‍රපට වෙනුවෙන් ලබා දී තිබූ, රු.44,531,267 ක්ද වර්ෂ 5කට වැඩි කාලයක සිට අයනොවී පැවතුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ආයතනයේ පුස්තකාලය සතුව පොත් 414 ක් හා DVD තැටි 527 ක් පැවතියද ඒවා පාඨකයන්ට පරිශීලනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් පුස්තකාලය වෙත සපයා දී නොතිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2014 වර්ෂයට පෙර පෞද්ගලික බැංකුවක ආරම්භකර තිබූ බැංකු ගිණුමක රු.250,000 ක අවම ශේෂය පවත්වා නොගැනීම නිසා රු.100,949 ක්ව තිබූ ශේෂය වාර්ෂිකව රු.10,000 බැගින් රු. 60,949 දක්වා අඩු වී තිබුණි. එම බැංකු ගිණුමේ ශේෂය සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලද අනාවරණය කර නොතිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සරසවි චිත්‍රාගාරයේ කලු සුදු සහ වර්ණ රසායනාගාරවල ඇති ස්ථාවර වත්කම්වල වටිනාකම හඳුනා ගැනීමක්, ලේඛනගත කිරීමක් හෝ ගිණුම්ගත කිරීමක් සිදු කර නොතිබූ අතර තාක්ෂණය ඉකුත්වීම හේතුවෙන් අභාවිතව තිබුණි. සමහර යන්ත්‍ර ස්ථානගත කර ඇති ගොඩනැගිලිවල සතුන් ලැගීම නිසා එම යන්ත්‍ර වල ආරක්ෂාවට තර්ජන එල්ල වී ඇති බව ද නිරීක්ෂණය විය.

(ආ) වටිනාකම රු. 156,800 ක් වූ ත්‍රී රෝදරථයක් 2014 මාර්තු මාසයේ සිට අළුත්වැඩියා කර නොතිබීම නිසා ධාවනයෙන් ඉවත් කර තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ සුභසාධන සංගමයෙන් ලබා දී තිබූ පුස්තකාල පොත් 500 කට වැඩි ප්‍රමාණයක් කැලණිය සරසවි චිත්‍රාගාරය තුළ අනාරක්ෂිතව ගොඩගසා තිබීම නිසා දිරාපත්වෙමින් පැවැතුණි.

4.6 හඳුනාගන්නා ලද පාඩු

විවිධ හේතුන් මත සේවය අවසන් කළ නිලධාරින් 8 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.161,816 වටිනා ජංගම දුරකථන ආපසු භාරගෙන නොතිබුණි.

4.7 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 වගන්තිය ප්‍රකාරව දේශීය සැපයුම්කරුවන්ගේ හැකියාව සීමා සහිත වනවිට හා ජාත්‍යන්තර ලංසු කැඳවීම වාසි දායක වන විට ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරයක් ලබාදිය යුතු වුවත් ඉන්දියාවෙන් කාබන් කූරු මිලදීගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව එක් සැපැයුම්කරුවකුගෙන් පමණක් වසර 05 ක කාලයක් නොකඩවා මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ආ) සාමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රු.10,000 ක මාසික බද්දක් මත බදුකරුවෙකු තෝරාගෙන ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව වෙළඳ අයිතිය පවරා තිබුණි. එහෙත් නිසි පරිදි සේවය නොසැපයීම මත 2015 නොවැම්බර් සිට බදුකරු ඉවත්කර ආපනශාලාව වසා දමා තිබුණි. තවද ආපනශාලා බදුකරු සංස්ථාවට එරෙහිව නඩු පැවරීම නිසා 2016 වර්ෂයේදී රු. 98,950 ක් එම නඩුවේ නීතිඥ ගාස්තු ලෙස බාහිර නීතිඥවරයෙකුට ගෙවීමට නියම වී තිබුණි.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු තනතුරු 67 ක්වූ ඒ අතර සංස්ථාවේ ප්‍රධාන මාණ්ඩලික තනතුරු 03ක්, වසර 03 ත් 06 ත් අතර කාලයක් තිස්සේම පුරප්පාඩු වී තිබීම හේතුවෙන් ඉහළ කළමනාකාරීත්වයේ මග පෙන්වීමක් හා අධීක්ෂණයක් යටතේ සැලසුම් සකස් කිරීම හා ඉලක්කයන් ගොඩනැගීමත් ඒවා ළඟාකර ගැනීමට මෙහෙයවීමත් සිදුවී නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ පුරප්පාඩු වී පවතින තනතුරු පිරවීම සඳහා 2015 ජූනි 15 දින රු.17,413 ක් වැයකර පුවත්පත් 06 ක දැන්වීම් පලකර තිබුණ ද ලැබුණු අයදුම්පත් පිළිබඳ සලකා බලා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හෝ බඳවාගැනීමේ කටයුතු 2016 නොවැම්බර් 30 දින වන විටත් සිදුකර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2016 ජූලි 12 දිනදීය.

5.2 සංයුක්ත සැලැස්ම

2012- 2015 වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද 2015 වර්ෂයට ගැලපෙන පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

2012-2015 කාලය සඳහා සංයුක්ත සැලැස්මේ අරමුණු පාදක කරගෙන සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණ අතර පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ කාර්තුමය වශයෙන් ඉලක්කගත ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණ ද එහි කාර්යසාධනය ඇගයීමට හැකිවන පරිදි කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

5.4 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කළ ලිඛිත වාර්තා අනුව 2013 වර්ෂය සඳහා විගණන විමසුම් 45 ක් ද, 2014 වර්ෂය සඳහා 36 ක් ද සමාලෝචිත වර්ෂය සඳහා විමසුම් 41 ක්ද වශයෙන් විගණන විමසුම් 122 ක් නිකුත් කර තිබුණද, කළමනාකරණය විසින් 2016 අගෝස්තු 31 දින වන විටත් එම විමසුම් සඳහා පිළිතුරු ලබාදී නොතිබුණි. තවද එම විමසුම් වල පිටපත් මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමද සිදුකර නොතිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයට අනුව අභ්‍යන්තර විගණන අංශයේ ස්ථිර විගණන සහායක තනතුරු 03 ක් පැවතියද 2016 නොවැම්බර් 30 දිනට එක් සහායකයකු පමණක් සේවයේ යොදවා තිබූ නමුත් 2016 දෙසැම්බර් 31 දින වනවිට ඔහුද සංස්ථාවෙන් ඉවත්වී තිබුණි.

5.5 විගණන හා කළමනාකරණ කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක්වත් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

5.6 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා 4.2.2 අනුව ප්‍රසම්පාදන කාලසටහනක් ද, සකස්කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි.

5.7 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2013 හා 2014 වර්ෂවල වාර්ෂික වාර්තා 2017 අප්‍රේල් 30 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) වත්කම් පාලනය	(i) චිත්‍රාගාරයේ තිබෙන නිෂ්කාර්ය වත්කම් හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදුකර නොතිබීම.
	(ii) පුස්තකාල පොත් අනාරක්ෂිතව පැවතීම.
	(iii) වට්ටෝරු භාණ්ඩ ලේඛනය ලැබීම් නිකුත් කිරීම් හඳුනා ගැනීමට පහසු වන ආකාරයෙන් නිසි පරිදි නඩත්තු කර නොතිබීම.

(ආ) ණයගැති පාලනය

(i) වර්ෂ 10 කට වඩා පැරණි ණය ශේෂ අය නොවී පැවතීම.

(ii) ණය ගිවිසුම් පිළිබඳ නිසි අධීක්ෂණයක් නොතිබීම.

(ඇ) මූල්‍ය පාලනය

(i) තැපැලෙන් යවනු ලබන සියලුම චෙක්පත් පිළිබඳව සියලු විස්තර ඇතුළත් ලේඛනයක් නඩත්තු කර නොතිබීම.

(ii) ආදායකයාගේ අනන්‍යතාවය නිසි පරිදි තහවුරු කිරීමකින් පසුව චෙක්පත් අතට භාරදිය යුතු වුවත් එසේ කර නොතිබීම.

(iii) පාවිච්චි නොකරන ලද චෙක්පත් සේප්පුවක හෝ ආරක්ෂිත ස්ථානයක අගුලු ලා නොතිබීම.

(iv) බැංකු ගිණුම් 06 කට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම, පරීක්ෂා කිරීම හෝ සහතික කිරීම සඳහා අත්සන් යොදා නොතිබීම.

(v) දිනපතා මුදල් පොතේ ලැබීම් සහ ගෙවීම් තුලනය කර වගකිව යුතු අධීක්ෂණ හෝ මාණ්ඩලික නිළධාරියකු විසින් නිවැරදිතාවය පරීක්ෂාකර නොතිබීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்

National Film Corporation of Sri Lanka

අංක 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. | දුරකතන - 0112-584623 / 0112-588773 | විද්‍යුත් තැපැල-filmcorp@sltnet.lk | වෙබ් අඩවිය -www.nfc.gov.lk
இல.303, பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07. | தொலைபேசி-0112-584623 / 0112-588773 | மின்னஞ்சல் புத்குகதுின்-filmcorp@sltnet.lk | இணையத்குளம்-www.nfc.gov.lk
No.303, Bauddhloka Mawatha, Colombo 07. | Tel - 0112-584623 / 0112-588773 | Email-filmcorp@sltnet.lk | Website-www.nfc.gov.lk